2018 ජනවාරි
01 කාණ්ඩය 04 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට



## බලන් පෙරඹර
## නැගෙන රතු හිරු...

අනෙකාගේ සුසුමින් හදවත රිදුම් දුන්... 02



ආණ්ඩුවත් එක්ක ඩීල් දාන "ඩෝල්"... 08



අන්තර්ජාලය අධිවේගවත් කරන... 08



යොවුන් නාට්‍යය උළලේ... 11



# අනෙකාගේ සුසුමින් හදවත රිදුම් දුන් එමිලි ඩැවිෂන්

## EMILY DAVISON



අප මේ පසු කරන්නේ මැතිවරණ සමයකි. තමන්ට හිමිව තිබෙන ඡන්දය ලබාදීමේ අයිතිය නිවැරදිව අවබෝධයෙන් යුතුව පාවිච්චි කරන්නට නැවත වරක් අවස්ථාවක් ලැබී තිබෙනවා. ජීවිතය පුරා නැවත හරිගස්සන්නට පුළුවන් අවස්ථා ලැබේ නම් කොතරම්ම අගනේද? නමුත් ජනතාව මේ අවස්ථාවන් කොතරම් මඟහැර යනවාද? ඒ ගැන සිතන්න, නැවත වරක් සිතන්න කාලය ඇවිත්. ඒත් මේ කියන්න සූදානම් වෙන්නෙ ඡන්ද ගැන නොවෙයි. ඒ අයිතිය දිනාගැනීම වෙනුවෙන් දිවි පිදූ, අනෙකුන්ගේ සුසුම්වලින් හදවත රිදුම් දෙන පරපුරක තවත් ශක්තිමත් එඩිතර වීරවරියක් ගැනයි.

එමිලි ඩැවිෂන්. 1872 ඔක්තෝබර් 11 දින ලන්ඩන් හි උපත ලැබූ ඇය දරුවන් හතර දෙනෙකුගෙන් යුත් පවුලේ තුන්වැනි දරුවායි. වයස අවුරුදු 11 වනතුරු නිවසේදීම අධ්‍යාපනය ලැබූ ඇය පසුව කෙන්සින්ග්ටන් උසස් පාසලට ඇතුළත් වුණා. එහිදී ඇයට ශිෂ්‍යත්වයක් ලැබී 1891 දී රෝයල් හොලොවේ විද්‍යාලයට ඇතුළත් වීමට හැකිවුණා. ඒ සාහිත්‍යය ඉගෙනීම සඳහායි. නමුත් 1893 දී පියාගේ වියෝවත් සමඟම එමිලිගේ අධ්‍යාපනයත් අවසන් වුණා. ඒ ඇගේ පාසල් වාර ගාස්තු ගෙවීමට මවට හැකියාවක් නොතිබූ නිසායි.

එයින් පසුව ඇය රැකියාවක් ලෙස නිවෙස්වලට ගොස් උගන්වන්නට පටන්ගත්තා. ඒ අතරතුර නැවතත් සිය අධ්‍යාපන කටයුතු කරගෙන යන්නට ඇය තීරණය කළා. ඒ අනුව ඔක්ස්ෆර්ඩ් හි ශාන්ත හග්ස් විද්‍යාලයට ඇතුළත් වුණා. එහිදී එමිලි ඉංග්‍රීසි සඳහා පළමු පන්තියේ ගෞරව උපාධියක් හිමිකර ගත්තා. නමුත් ඇයට උපාධිධාරිනියක් වන්නට හැකියාවක් ලැබුනේ නැහැ. මොකද ඒ වෙනකොටත් ඔක්ස්ෆර්ඩ්වල කාන්තාවන්ට උපාධි ලබානොදුන් නිසා. නමුත් මේ බාධක මැඩගෙන නොසැලී නොනැවතීම ඇගේ අධ්‍යාපන අයිතීන් වෙනුවෙන් කැපවෙමින් 1908 දී ලන්ඩන් සරසවියෙන් තුන්වන පන්තියේ ගෞරව උපාධියක් හිමිකර ගැනීමට ඇයට හැකිවුණා.

මේ කාලය අතරතුර එමිලි, Women’s Social and Political Union" (WSPU) සංවිධානය හා සම්බන්ධ වෙමින් නිර්භය, අන්තරායන් නොතකන, සටන්කාමී චරිතයක් ලෙස ක්‍රියාකරන්නට වුණා. පෙළපාළි උද්ඝෝෂණ සඳහා සහභාගී වෙමින් කාන්තා විමුක්තිය වෙනුවෙන් සටන් වැදුණා. 1909දී පළමු වතාවට පොලිස් අත්අඩංගුවට පත්වූ ඇයට මාසයක සිරදඬුවමක් ලැබුණා. පසුකාලීනව සිය රැකියාවද කැපකරමින් ඇය පූර්ණකාලීනව දේශපාලන කටයුතුවල නිරත වුණා.

20 වන සියවසටත් පෙරදී කාන්තා ඡන්ද අයිතිය දිනාගැනීම වෙනුවෙන් සටන් කළ නිර්භීත කාන්තා චරිතයක් ලෙස ඉතිහාසගත වන්නට එමිලි ඩැවිෂන් සමත් වුණා. ඇගේ ක්‍රියාකාරී දේශපාලන ජීවිතය තුළදී 09 වතාවක් අත්අඩංගුවට පත්වූ අතර ඉන් හත් වතාවක් පමණම ඇය කෑම ප්‍රතික්ෂේප කරමින් විරෝධතා දැක්වූවා. එහිදී 49 වතාවක් ඇයට බලෙන් ආහාර කැවීම සිදුකර තිබුණා. ඒ වගේම නොයෙකුත් වධ බන්ධනයන්ටද ලක්කෙරුණා.

වචනවලට සීමා නොවුණු ක්‍රියාවන්ගෙන් පිරි ඇගේ ජීවිතය, තම වර්ගයාගේ අයිතීන් දිනාගැනීමත් ඒවා ආරක්ෂා කිරීමත් වෙනුවෙන් සටන් කරමින් ඒ වෙනුවෙන්ම කැප කළා. ලන්ඩනය පුරා සියදහස් ගණනින් ජනතාව ඇගේ ජීවිත පරිත්‍යාගය වෙනුවෙන් සිය ආචාරය පුද කළ අතර ඇය කාන්තා විමුක්තිය සඳහා දිවිපිදූ ශ්‍රේෂ්ඨ කාන්තාවක් ලෙස ඉතිහාසයට එක්වූවා. එයින් ඇගේ නාමයත් ඇගේ සටනත් ජයග්‍රහණය කරවීමට හැකිවුණා. ඇගේ සටනේ ප්‍රතිඵලයන් අනාගත පරපුරට ලැබුණා. ඒ ඇගේ මරණයෙන් ආසන්න වශයෙන් වසර 15කට පමණ පසු 1928 දී කාන්තා ඡන්ද අයිතිය ලබාදීමට බ්‍රිතාන්‍ය රජයට සිදුවීමත් සමඟයි. වයස අවුරුදු 40ක් වූ ඇගේ කෙටි උදාර ජීවිතය, මුළුගැන්වී කොන්වී සිටින ලොව පුරා කාන්තාවන්ගේ අයිතීන් දිනාගැනීම උදෙසා වන නොනිම් අරගලයට ශක්තියක් එක්කරමින් තවමත් ආලෝකය විහිදුවනවා.

## ජ.වි.පෙ. පළාත් පාලන අපේක්ෂකයින්ගේ ජාතික මහ සමුළුව මුළුදෙයි



මෙවර පළාත් පාලන මැතිවරණයට ජනතා විමුක්ති පෙරමුණෙන් තරඟ වදින අපේක්ෂකයින්ගේ ජාතික මහ සමුළුව පසුගිය දෙසැම්බර් 17 දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්වීය. මෙහිදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා යන සහෝදරවරු විසින් ප්‍රධාන දේශන පැවැත්වූ අතර විශ්වවිද්‍යාල ආචාර්යවරු හා කලාකරුවෝ ඊට සුභපැතුම් එක් කළහ. එසේම මේ සඳහා කලාකරුවන්, බුද්ධිමතුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මෙන්ම සිවිල් ක්‍රියාකාරීන් හා මෙවර මැතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයින් විශාල පිරිසක් ද සහභාගී වූහ.

## දකුණේ රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ඉල්ලා මහපාරට



දකුණු පළාත් රැකියා විරහිත උපාධිධාරී සංගමය හා උපාධිධාරී ජාතික මධ්‍යස්ථානය එක්ව පසුගිය දෙසැම්බර් 06 දින දකුණු පළාත් සභාව ඉදිරිපිටදී විරෝධතාවයක නිරත වූහ. ගුරු විභාගය සමත් උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගන්නා ලෙසටත් සියලුම උපාධිධාරීන්ට වහාම රැකියා අවස්ථා උදාකර දෙන ලෙසටත් බලකරමින් මෙම විරෝධතාවය පැත්විණි.

එම අවස්ථාවට දකුණු පළාත් රැකියා විරහිත උපාධිධාරී සංගමයේ කැඳවුම්කරු මහේෂ් විමුක්ති මහතා සහ උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චි මහතාද එක් වූ අතර ඊට දකුණු පළාතේ රැකියා විරහිත උපාධිධාරීන් විශාල පිරිසක් ද සහභාගී වූහ.

## පොහොර සහනාධාර බොහෝ ගොවීන්ට ලැබී නැහැ



ආණ්ඩුව විසින් පොරොන්දු වූ පොහොර සහනාධාර මුදල් බොහෝ ගොවීන්ගේ බැංකු ගිණුම් සඳහා මේ වන තුරුත් බැර කර නොමැති බවත් කලට වේලාවට පොහොර නොලැබීම හේතුවෙන් වගාවන් විනාශ වෙමින් පවතින බවත් සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා ප්‍රකාශ කළේය. ඒ පසුගිය දා දඹුල්ලේ දී පැවති මාධ්‍ය හමුවක් අතරතුරදීය.

එහි දී ඔහු විසින් තවදුරටත් අදහස් දක්වමින් කියා සිටියේ ගොවීන් තම කනකර ආභරණ උගස් කරමින් හෝ ණය වී හෝ මුදල් සොයාගෙන පොහොර මිලදී ගැනීමට වෙළඳපොළට ගිය විට පොහොරවලට අමතරව වෙනත් පොහොර හෝ කෘමිනාශක වර්ග ද මිලදී ගැනීමට ගියවිට බලකර සිට ඇති බවත් එබැවින් ගොවීන් දැඩි අසීරුතාවයකට පත්ව ඇති බවත්ය.

මෙම මාධ්‍ය හමුවේදී සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ උප සභාපති සුසන්ත කුමාර නවරත්න, ලේකම් ටී.බී. සරත් සහ සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ විධායක සභික, මඩාටුගම ගොවි සංවිධානයේ සභාපති සිදත් චාමර බණ්ඩාර යන ගොවි නායකයෝද අදහස් පළ කළහ.

## ජෙරුසලම පලස්තීනයේ අගනුවර ලෙස පිළිගනු!



ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ඊශ්‍රායලයේ අගනුවර ජෙරුසලම ලෙස නම් කිරීමට එරෙහිව ආගමික නායකයින්ගේ විදේශීය තානාපතිවරුන්ගේ සියලුම දේශපාන පක්ෂවල නියෝජිතයින්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද විරෝධතා රැස්වීමක් පසුගිය දෙසැම්බර් 22 දා කොළඹ නව නගර ශාලාවේදී පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ පලස්තීන සහයෝගීතා කමිටුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පලස්තීන මිත්‍රත්ව සංගමය සහ ගෝලීය යුක්තිය සඳහා වූ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ඒකාබද්ධව සංවිධානය කළ මෙම විරෝධතා රැලිය සඳහා ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපති සුහයීර් හම්දලාහි සයිඩ් මහතා හා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් එහි ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා ඇතුළු පිරිසක් සහභාගී වූහ.

මේ අතර එහිදී ඇමරිකානු ජනාධිපතිවරයාගේ ප්‍රකාශයට එරෙහිව පෙත්සමක් හා පලස්තීනයට සහයෝගය පළකරමින් බැනරයක් අත්සන් කිරීමටද කටයුතු කළ අතර එම ප්‍රකාශය හෙළා දකිමින් දේශපාලන පක්ෂ නියෝජිතයන් විසින් ද ප්‍රකාශයකට අත්සන් කිරීමට කටයුතු කරන ලදී.



# ජවිපෙ හැමවිටම අනාගතය නියෝජනය කරන පක්ෂයක්

*ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා සමඟ කළ සංවාදයකි.*

**මෙවර පළාත් පාලන මැතිවරණයෙන් අපේ රටේ තාරුණ්‍යයට මොන වගේ අවස්ථාවන් හිමිවෙයිද?**

නව ඡන්ද ක්‍රමය (කොට්ඨාස ක්‍රමය) නිසා වැඩි අපේක්ෂක පිරිසකට අපේක්ෂකත්වය හිමිවෙනවා. වැඩි පිරිසකට ජයග්‍රහණය කිරීමේ අවස්ථාව හිමිවෙනවා. මීට කලින් තිබුණු ඡන්ද ක්‍රමයට අනුව විශාල ප්‍රදේශයක මැතිවරණය කරන්න සිද්ධවුණා. ඒ වගේම විශාල මුදලකුත් වැය කරන්න සිදුවෙනවා. පුද්ගලයෙක්ව විශාල ප්‍රදේශයක් තුළ හඳුනගන්න දිගු කාලයක් අවශ්‍යයි. නමුත් මෙහි දී තරුණයෙක්ට ජීවත් වෙන ගම ඇතුළෙ අපේක්ෂකයෙක් වෙන්නත් තමන් දන්න ප්‍රදේශයක පුද්ගලයින් හඳුනගන්නත් පහසුයි. ඒ වගේම ඔවුන් සමාජයේ යම් ක්‍රියාකාරී අයෙක් නම්, තරුණ සමාජයක, ක්‍රීඩා සමාජයක, යෞවන සමාජයක ක්‍රියාකාරී අයෙක් නම්, පොදු කටයුතුවලට සම්බන්ධ වුණු කෙනෙක් නම් ජයග්‍රහණය කිරීමේ වැඩි ඉඩකුත් නිර්මාණය වී තිබෙනවා. මෙම මැතිවරණ ක්‍රමය සකස් කරගැනීමේදී ජනතා විමුක්ති පෙරමුණ විසින් සුවිශාල කාර්යභාරයක් ඉටුකළා. එයින් පොදුවේ තරුණ තරුණියන්ට විශාල ඉඩකඩක් ලැබී තිබෙනවා. ඒ වගේම විශාල වශයෙන් තරුණ සහෝදර සහෝදරියන්ට අවස්ථා හදලා දීලා තිබෙනවා.

**මැතිවරණ සමයේ දී තරුණයින්ගේ වගකීම කෙබඳුද?**

මෙවර පළාත් පාලන මැතිවරණය රටේ අනාගත දේශපාලන පරිවර්තනයක පළමු අඩිතාලම කරගන්න පුළුවන්. විශේෂයෙන්ම අවුරුදු හැත්තෑවක් තිස්සේ රට පාලනය කළ එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් පොදුවේ මේ රටේ තරුණ පරම්පරා රාශියකගෙ අනාගතය විනාශ කරලයි තියෙන්නේ. දැන් ඉන්න තරුණ පරම්පරාවත් එයට ගොදුරු වෙමිනුයි සිටින්නේ. ඒ නිසා මෙම මැතිවරණයේදී ඒ පක්ෂ දෙකම අභිභවා ජනතා විමුක්ති පෙරමුණ විසින් ලබාගන්නා ජයග්‍රහණය ඉතාම වැදගත්. එය 2020 දී එන මහ මැතිවරණයට වගේම 2020 දී දේශපාලන පරිවර්තනයක් සිදුකර ගැනීමටත් උපයෝගී කරගැනීමට ජනතා විමුක්ති පෙරමුණ බලාපොරොත්තු වෙනවා. ඒ නිසාම මෙවර මැතිවරණයේදී තරුණ තරුණියන් ජනතා විමුක්ති පෙරමුණ මත තබන විශ්වාසය 2020 දී සිදුකරන්න නියමිත දේශපාලන පරිවර්තනයට විශාල ශක්තියක්. ඇත්තටම තරුණයෙක්, තරුණියක් ලෙස තමන්ට යහපත් අනාගතයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය නම් ඒ වෙනුවෙන් තමනුත් දායක වෙන්න ඕන. ඒ සඳහා ලැබෙන අවස්ථාවක් ලෙස සලකා මෙවර පළාත් පාලන මැතිවරණයේදී තරුණ තරුණියන්ගෙ පැත්තෙන් ජනතා විමුක්ති පෙරමුණ ශක්තිමත් කිරීම කළ යුතුයි.

> **මෙවර මැතිවරණයේදී තරුණ තරුණියන් ජනතා විමුක්ති පෙරමුණ මත තබන විශ්වාසය 2020 දී සිදුකරන්න නියමිත දේශපාලන පරිවර්තනයට විශාල ශක්තියක්.**

**මැතිවරණයත් සමඟ අපේ රටේ තාරුණ්‍යය රවටන හා රැවටෙන අවස්ථා බහුලයි. ඒ පිළිබඳව ඔබේ අදහස මොකක් ද?**

රවටන එක හෝ රැවටෙන එක අමුතු තත්වයක් නෙවෙයි. වසර ගණනාවක් තිස්සේ දිගටම අපේ රටේ තරුණයොත් වැඩිහිටියොත් ප්‍රධාන ධනපති දේශපාලන පක්ෂ දෙකට රැවටෙනවා. දේශපාලඥයො නොයෙක් බොරු පොරොන්දු දෙනවා. තරුණයන්ට රැකියා සම්බන්ධ බොරු පොරොන්දු දෙනවා. ඔවුන් තවමත් රැවටෙනවා. ඒක නිසා මම හිතන්නෙ මේ පක්ෂ දෙකම ජනතාව රවට්ටන්න යොදාගන්නේ පරණ ක්‍රමයන්මයි. ඒවටත් රැවටෙනවා කියන්නෙ ඉතාම බාල තත්වයක්. ඒ නිසා කාටවත් රැවටෙන්නෙ නැතුව, කාටවත් තමන්ව රවට්ටන්න දෙන්නෙ නැතුව තමන්ගෙ බුද්ධිය පාවිච්චි කරලා වැඩ කරන්න කියන පණිවිඩය තමයි අපේ රටේ තාරුණ්‍යයට දෙන්න තියෙන්නෙ.

**ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය තුළ තාරුණ්‍යය නගාසිටුවීම වෙනුවෙන් ගෙන ඇත්තේ කෙබඳු ක්‍රියාමාර්ග ද?**

ජනතා විමුක්ති පෙරමුණ හැමවිටම අනාගතය නියෝජනය කරන පක්ෂයක්. මේ රටේ තරුණ තරුණියන්ට අදාළව ගත්තොත් අධ්‍යාපනය කියන්නේ ඔවුන්ට තිබෙන විශේෂතම අවස්ථාවක්. ජනතා විමුක්ති පෙරමුණ සෑම ආණ්ඩුවකින්ම ජනතාවට නොමිලේ අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් පෙනී සිටි, සටන්වැදි, අරගල කළ පක්ෂයක්. මෑතකදී කළ සයිටම් සටනත් අපේ තරුණ තරුණියන් වෙනුවෙන්, අනාගත පරපුර වෙනුවෙන් කළ සටනක්. තරුණ තරුණියන්ට ඔවුන්ගේ රැකියා පැත්තෙන් ගත්තත්, සුදුසුකම් තියෙන අයට රැකියා ලබාදෙන්න ඕන කියන ප්‍රතිපත්තියේ සිටිමිනුයි ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරන්නෙ. ඒ නිසා දේශපාලනිකව පක්ෂග්‍රාහී ලෙස පත්වීම් ලබාදීමට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරනවා. ඒ වගේම එසේ දේශපාලනිකව පක්ෂග්‍රාහී ලෙස රැකියා ලබාගත්ත තරුණ තරුණියන්ව ආණ්ඩු මාරුවෙද්දි රැකියාවලින් දොට්ට දානකොට මොකද ජ.වි.පෙ. තමයි ඔවුන්ගෙත් ආරක්ෂකයා ලෙස පෙනී සිටින්නේ. එක පක්ෂයකින් රැකියා ගත්ත අය ඉවත් කරලා තවත් පක්ෂයකින් රැකියා ලබාදෙන්න එපා කියන ස්ථාවරයෙයි ජනතා විමුක්ති පෙරමුණ ඉන්නෙ. ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පෙනී සිටිනවා.

මීටත් අමතරව තරුණ තරුණියන්ගේ අනාගතයට සෘජුවම බලපාන දෙයක් තමයි පරිසරය. අද රටේ පරිසරය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් පෙනීසිටින ප්‍රධානතම දේශපාලන ව්‍යාපාරය බවට පත්වෙලා තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. ඒ වගේම අපි දන්නවා අපේ රටේ යුද්ධයක් තිබුණා. එය ජාතිවාදය මත පදනම්ව ඇති වුණු යුද්ධයක්. නැවතත් ජාතිවාදය ඇති වුවහොත් එයින් විශාල බලපෑමක් සිදුවන්නේ තරුණ ප්‍රජාවටයි. ඒ නිසා ජාතිවාදයට විරුද්ධවත් ජනතා විමුක්ති පෙරමුණ මැදිහත් වීමක් සිදුකරනවා. ඒ ආකාරයට රටේ අනාගතය වෙනුවෙන්, තරුණ ප්‍රජාව වෙනුවෙන්, අනාගත පරපුර වෙනුවෙන් සාධනීය මැදිහත්වීම් සිදුකරන දේශපාලන පක්ෂයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණ පෙනී සිටිනවා.

# තරුණ විරැකියාව ඉහළට




තරුණයා හා රැකියාව ඉතා සමීප ඥාතීන්ය. යමෙක් තාරුණ්‍යයට එළැඹෙන විටම මේ අනිවාර්යය ඥාතීත්වය හිමිකර ගනියි. එහෙත් ශ්‍රී ලංකාව තුළ නම් තරුණයා හා රැකියාව අතර ඇති සබැඳියාව ඉතා සෝචනීයය. මෙහි පහත කරුණු අනාවරණයට පාදක වන්නේද මේ නෑකමේ නොපෑහීමයි.

ශ්‍රී ලංකා මහ බැංකු වර්තාවට අනුව තරුණ වයස් කණ්ඩය (අවු. 15-24) හි සේවා වියුක්ති අනුපාතිකය 2015 ට සාපේක්ෂව 2016 වසරේදී ඉහළ ගොස් ඇත. ඒ 2015 දී 20.8% ක් ලෙසත් 2016 දී 21.6% ක් ලෙසත්ය. එසේම තරුණයින්ගේ හැකියාවන්ට සුදුසු රැකියාවක් සොයාගැනීමට ඇති දුෂ්කරතා හේතුවෙන් ඔවුන් ගුණාත්මක බවින් අඩු රැකියාවල නිරත වීමට හා ඌන රැකියා නියුක්ති තත්වයට පෙළඹීමටද ඉඩ ඇති අතර එය ඔවුන්ට දරිද්‍රතාවයෙන් මිදීමට හා ආර්ථිකයේ සමස්ත වර්ධනයේ කොටස්කරුවන් බවට පත්වීමට ඇති මාර්ග අවහිර කරනු ඇත.

මීට අමතරව 2015 වසරේ මෙරට ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාවේ නව මිනුමක් ලෙස "රැකියාවක, අධ්‍යාපනයේ හෝ පුහුණු කටයුතුවල නොයෙදෙන" (NEET - Not in Employment, Education or Training) අනුපාතය ඇතුළත් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ සෑම තරුණයින් සිව්දෙනෙකුගෙන් එක් අයෙකු මේ කාණ්ඩයට ඇතුළත් බව අනාවරණය වී තිබේ. එම ප්‍රතිශතය 2015 දී 25.8% ක් වූ අතර ඉන් තරුණ ස්ත්‍රී NEET ප්‍රතිශතය පුරුෂ NEET ප්‍රතිශතය මෙන් දෙගුණයකටත් වැඩි විය.

මෙයින් ප්‍රකාශ වන්නේ ආර්ථිකය තුළ තරුණයින්ගේ අක්‍රීය බව හා අනාගතය සම්බන්ධ අවදානම් තත්වයන්ය. මේ තත්වය තුළ ඔවුන් දරිද්‍රතා රේඛාවේ පහළ මට්ටමක රැඳීම ද මානසික මෙන්ම ආර්ථික හා සමාජීය ගැටලු ඇති වීමද නොවැළැක්විය හැක. දිගුකාලීනව ගත්කල ශ්‍රම බලකායේ නිපුණතා පිරිහීමට ද මෙම NEET අගය බලපායි.

ලෝකයේ සංවර්ධිත රටවල ආර්ථික සංවර්ධනය සැලකීමේ දී එම වකවානු තුළ ඒ ඒ රටවල ඉහළ තරුණ ශ්‍රම බලකායක් පැවති බව පැහැදිලි කරුණකි. නමුත් ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා ලේඛන හැදෑරීමේ දී දැවැන්ත තරුණ ශ්‍රම බලකායක් පැවතියද එම මානව සම්පත රටේ ආර්ථික සංවර්ධනයට යොදාගැනීම පිළිබඳ වැඩපිළිවෙළක් රජය සතුව නැත.

තරුණ විරැකියාව පිළිබඳ සංවාදවල දී නිරන්තරව පැනනගින හේතු අතර කුසලතා නොගැළපීම, මූල්‍ය පහසුකම් නොමැති වීම හා රැකියා ඉලක්ක කරගත් පුහුණු පාඨමාලා නොමැති වීම ප්‍රධානය. එසේම ශ්‍රී ලංකාව රටක් ලෙස තාක්ෂණය හා ආකල්පමය අතින් ඇත්තේ පසුගාමී තැනකය. රජය විසින් මෙම ගැටලුවලට විසඳුම් සෙවීමට ප්‍රමුඛතාව ලබා දිය යුතු නමුත් පසුගිය අයවැයේදී ද ගනු ලැබූ ප්‍රගතිශීලී පියවරක් නැත. එහෙත් ඒ වෙනුවට විදෙස් ශ්‍රමිකයින් ගෙන්වීම වැනි වැරදි ආර්ථික පිළිවෙත් සඳහා අවතීර්ණ වීමට රජය උත්සාහ කරයි. එය මෙරට තරුණ පරම්පරාව තවදුරටත් අර්බුදයට පත්කිරීමට හේතුවක් වනු ඇත. මේ අතර පසුගිය කාලය තුළ දී රැකියා විරහිත උපාධිධාරීන් විසින් රැකියා ඉල්ලා කරනු ලැබූ ක්‍රියාමාර්ග රැසක්ද මාධ්‍ය තුළ ප්‍රචාරය විය.

ශ්‍රී ලංකාව සැබෑ ලෙසම සංවර්ධන මාවතකට ගෙන වීමට නම් තරුණ විරැකියාව අඩු කළ යුතුමය. ඒ සඳහා රජයක් සතු ප්‍රමුඛ කාර්යභාරයන් රැසක් පවතී. වෘත්තීය පුහුණු පාඨමාලා, මූලාධාර හා කුසලතා සංවර්ධන කටයුතු ආදී සාම්ප්‍රදායික ක්‍රියාමාර්ගවලට අමතරව අද ලොවට ගැළපෙන නව රැකියා බිහි කිරීමද අධ්‍යාපනය හා තාක්ෂණය අතර පවතින හිඩැස අඩු කිරීමද කළ යුතුය. එසේ සිදුකරමින් ආර්ථිකය තුළ සැබෑ පරිවර්තනයකට එළැඹීමට කටයුතු කිරීමෙන් විනා පැලැස්තර විසඳුම් තුළින් මෙරට ආර්ථිකය තවත් දශකයකින් හෝ ඉදිරියට ගෙනයනු නොහැකි බව අවධාරණය කළ යුතුව ඇත.

## ආණ්ඩුවත් එක්ක... 08 පිටුවෙන්

හා බුත්තල, වෑකඩ ප්‍රදේශයේ අක්කර 1200 ක් වශයෙන් කැවැන්ඩිස් කෙසෙල් ප්‍රභේදය වගා කිරීම සඳහා පසුගිය රජය සමයේ දී මැතිඇමතිවරු කිහිපදෙනෙකුගේම සහයෝගය මත නීතිවිරෝධී ලෙස මෙම සමාගමට ඉඩම් ලබා දී තිබේ.

මෙම ඩෝල් සමාගම විසින් මොනරාගල කෙසෙල් වගාව සඳහා එළිපෙහෙළි කර ඇති වනාන්තර, කිරිඳි ඔයේ හා මැණික් ගඟේ ජලපෝෂක ප්‍රදේශ වන අතර ඒවා වෙහෙරගල ජලාශයේ හා ලුණුගම්වෙහෙර ජලාශයේ ජලසුරක්ෂිතතාවය රඳා පැවති වනාන්තර බිම්ය. නමුත් අද වන විට ඒ සියලු ජලපෝෂක බිම් මේ ජලාශවලට හා ගංගාවලට සම්පූර්ණයෙන්ම අහිමි වී තිබේ. මේ වගා බිම්වලට විසුරුම් නළජල ක්‍රමය යටතේ ඉතාම අධික ජල ප්‍රමාණයක් දිනකට යොදයි. ඊට ජලය ලබා ගන්නේ ප්‍රධාන වශයෙන්ම ගංගාවලින් හා විශාල නළළිං සකස් කර භූගත ජලය අධික ලෙස පොම්ප මඟින් මතුපිටට ලබා ගැනීමෙනි.

කුඩාඔය වගාබිමට කිරිඳි ඔයෙන් විශාල ජල ප්‍රමාණයක් ලබාගන්නා අතර, වන්දම හා වෑකඩ වගා බිම්වලට මැණික් ගඟේ ජලය ලබා ගනී. මෙහි අහිතකර ප්‍රතිඵල භුක්ති විඳින්නේ මේ ගංගා පහළ ජීවත් වන ජනතාව හා වනසතුන්ය.

මීට අමතරව ඩෝල් සමාගමේ වගා බිම්වලට ඉතාම අධික ලෙස කෘෂි රසායනික යෙදීම සිදු කරයි. ඩැකෝනිල් වැනි විෂ රසායන මේ සඳහා යොදන අතර, ඒවා යෙදීම සිදුකරනුයේ රාත්‍රියේදී යාන්ත්‍රික රසායනික ඉසින භාවිතා කරමිනි. එයින් මීටර් 75 ක් පමණ දුරට එකවර රසායනික ඉසිය හැක. එම යන්ත්‍ර බවුසර් රථවලට සවි කර ජලයේ මිශ්‍ර කරන ලද රසායනික ද්‍රව්‍ය ඉසිනු ලැබේ. එසේ ඉසින රසායනික ද්‍රව්‍ය ඒ වටා ප්‍රදේශයේ මීදුමක් සේ විසිරීම සිදු වේ.

මේ නිසා රසායනික ද්‍රව්‍ය අධික ප්‍රමාණයක් බාහිර පරිසරයට ද සෘජුවම

ඩෝල් සමාගම සේවක අයිතීන් ලබා නොදීමට එරෙහි උද්ඝෝෂණය




ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයට ද ජනාවාස ආශ්‍රිත ප්‍රදේශවලට ද විසිරීම සිදුවේ. අවසානයේ මෙම රසායනික ද්‍රව්‍ය කිරිඳි ඔය හා මැණික් ගඟ හරහා ලුණුගම්වෙහෙර ජලාශයටත් වෙහෙරගල ජලාශයටත් එකතු වේ. එයින් මේ ජලාශ දෙකෙන් ජලය ලබාගන්නා සියලුම වගා බිම්වලට හා ජනතාවට මෙම විෂ රසායනවලින් අහිතකර සෞඛ්‍ය බලපෑම් එල්ල වේ. අද වන විට මෙම ප්‍රදේශවල ජනතාව වකුගඩු රෝගයට ගොදුරු වෙමින් සිටී. එපමණක් නොව ඩෝල් සමාගමේ වගා බිම්වල සේවයේ නියුතු අයටද විවිධ රෝගාබාධ, මළ දරු උපත් හා මදසරුභාවය වැනි තත්වයන්ට මුහුණ දීමට සිදුව ඇත.

ඩෝල් සමාගම මඟින් පළිබෝධනාශක බහා තබන කෑන් ඉතා විශාල ප්‍රමාණයක් අක්‍රමවත්ව බැහැර කිරීම හේතුවෙන් ඒවා වෙහෙරගල ජලාශයේ රැඳී තිබිණි. එයින් පෙනීයන්නේ ඩෝල් සමාගම ඉතාම අපරික්ෂාකාරී ලෙස, පරිසරය හෝ සේවක සෞඛ්‍ය ගැන හෝ නොතකමින් කටයුතු කරන බවයි.

එමඟින් ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය ආශ්‍රිතව පිහිටි වනාන්තර එළිපෙහෙළි කර විදුලි වැටවල් ස්ථාපිත කර ඇති හෙයින් අවතැන් වූ අලිඇතුන් ගම් වැදීමෙන් ගම්මාන 21ක් පමණ අද වන විට දරුණු ලෙස අලි - මිනිස් ගැටුමට ගොදුරුව ඇත. එම ප්‍රදේශවල බොහෝ ගොවි ජනතාව වගාබිම් අත්හැර ගොස් ඇත්තේ මෙම ගැටලුව හා උග්‍ර ජල ප්‍රශ්නයට මුහුණ දීමේ හැකියාවක් නොමැති වීමෙනි.

එසේ ඉවත් වන ගොවීන් මෑන්පවර් සමාගම් හරහා ඩෝල් සමාගමේ කම්කරුවන් ලෙස සේවයට බඳවාගෙන රුපියල් 525 ක දෛනික වැටුපක් ලබන වහලුන් බවට උපක්‍රමශීලීව පත්කර ඇත.

ඩෝල් සමාගම ලංකාවේ පමණක් නොව, ලෝකයේ බොහෝ රටවල පවා ඉතාම හානිකර ලෙස ක්‍රියාත්මක වන කළු ඉතිහාසයක් ඇති සමාගමකි.

එහෙත් ප්‍රදේශයේ දේශපාලඥයින් හා මහා පරිමාණ ව්‍යපාරිකයන් කිහිපදෙනෙකු විසින් ඩෝල් සමාගමේ මේ සියලු ක්‍රියාකාරීත්වයන්ට සහයෝගය දක්වයි. අලි-මිනිස් ගැටුමේ හා ජල අර්බුදයේ ගොදුරු බවට එම ප්‍රදේශයේ ජනතාව පත්කරවමින්, ඩෝල් සමාගම පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා සියලු වංචනික ක්‍රියා සිදුකරන ලද්දේ මේ දේශපාලකයින්ගේ පූර්ණ මැදිහත්වීම මතය.

පසුගිය රජයේ සමහර ඇමතිවරුන්ට ඩෝල් සමාගම විසින් අපනයනය කරන සෑම කෙසෙල් කිලෝවකින්ම කොමිස් මුදලක් හිමි වූ අතර සමහරුන් මෙම සමාගමට කුලී වාහන, සේවකයින් හා ඉඩම් සැපයීමේ කොන්ත්‍රාත් ඉටුකරමින් මුදල් ඉපැයීය.

ඉහත තොරතුරු සලකා බැලීමේදී පෙනී යන කරුණු රැසකි. ඩෝල් සමාගම යනු කිසිඳු විනයකින් හෝ සදාචාරයකින් තොර, ලාබය පමණක් අරමුණු කරගත් දූෂිත හා අපකීර්තිමත් සමාගමක් බව පැහැදිලිය. එසේම ඊටත් වඩා දූෂිත අපේ රටේ පාලකයින් විසින් හැමදාමත් සිදුකොට ඇත්තේ රට හෝ මහජනතාව හෝ අපේ රටේ වටිනා පරිසර පද්ධතීන් ගැන හෝ සිතීම පසෙකලා තම පුද්ගලික ලාබ අපේක්ෂාවෙන් වෙනුවෙන් එවැනි සමාගම්වලට කත් ඇදීමය. පැවති පාලනයේ මෙන්ම ජනාධිපතිවරයාම පරිසර ඇමතිකම දරන වත්මන් පාලනයේද ස්වභාවය එයමය.

එහෙයින් අපේ රටේ ජනතාවගේ ජීවිත ඉතා අසීරු අඩියකට ඇද දමමින් හා රටේ සම්පත් කොල්ලකමින් පවත්වාගෙන යනු ලබන මෙම ඩීල්කාරී ඩෝල් සමාගමට එරෙහිව ජනතාව එක්ව අරගල කළ යුතු කාලය එළැඹ තිබේ.

*පරිසරවේදී සජීව චාමිකර මහතා විසින් සම්පාදනය කරන ලද ලිපියක් ඇසුරෙනි.*

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# අපි අපිම වෙමු....

දුරුතු සීතලේ උණුසුම් කෝපි කෝප්පයක් තොල ගාන අතරේ පවා කල්පනා කළ යුතු වැදගත් දේ බොහෝයි. විශේෂයෙන්ම රටේ අනාගත නියමුවන් වන තරුණ අප වෙත, අපේ රටේ අනාගතය වෙනස් කිරීමේ තීරනාත්මක අවස්ථාවක්, උදා වූ වග වසර ආරම්භයේම ඇති බව කල්තියාම කිව යුතුය.

සුද්දො අපේ රට දාලා ගිහිල්ලා 2018 අවුරුද්දට හරියටම අවුරුදු 70ක් පිරෙනවා. මේ අවුරුදු 70 ඇතුළත අපේ රටේ පාලකයින් කිසිවෙකුටත් මේ රට අඩියක් තියා එක අඟලක්වත් ඉස්සරහට ගෙනියන්න බැරි වුණු බව නම් කණගාටුවෙන් වුවත් ලියා තැබිය යුතුමය.

සමාජයක් ලෙස ඉදිරියට ගියේ නම් එහි ප්‍රතිඵල සමාජීය සත්වයන් වන අප සියලු දෙනාටම භුක්ති විඳිය හැකිව තිබිණි. නමුත් අද අප භුක්ති විඳිමින් සිටින්නේ ප්‍රතිඵල වෙනුවට ප්‍රතිවිපාකය. දශක 07ක් මුළුල්ලේ ශ්‍රීලනිපය හා එජාපය ප්‍රමුඛ දේශීය ධනපති පක්ෂ විසින් මේ රට පාලනය කර තිබේ. ඒ ඒ පක්ෂ වෙන වෙනමත් 2015 අගෝස්තුවේ පටන් හවුලේත් රට පාලනය කරමින් ඇත්තේය. අවසන එකී වසර හැත්තෑවේම ශේෂ පත්‍රය 2017 වසර නිමාවීමත් සමඟ අප වෙත ලැබී ඇත්තේ මෙලෙසයි.

*මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන මරණ සංඛ්‍යාව 20,000 දක්වා ඉක්ම ගොස් ඇති අතර ආසියාවේ මත්ද්‍රව්‍ය බෙදාහරින කේන්ද්‍රස්ථානයක් බවට ද අපේ රට පත්ව ඇත.*

*පාසල් යා යුතු වයස අවුරුදු 5-17 අතර දරුවන් 452,661ක් පාසල් නොයන අතර ඉන් 51,249ක් කිසිදා පාසලකට ගොස් නැත.*

*ආසියාවේ මන්දපෝෂණයෙන් පෙළෙන රටවල් අතරින් 03 වන ස්ථානය දරන්නේද අපේ රටයි.*

*සෑම විනාඩි 90කටම වරක් ලංකාවේ කවර හෝ තැනකදී කාන්තාවක් දූෂණයට ලක් වේ.*

*සියදිවි නසාගැනීම් ගණන 2,675 කි.*

ඉඳින් කල්පනා කර බලන්න... ලාංකීය ජන ජීවිතය මෙලෙස ඛේදනීය තත්වයකට පත්වෙද්දී හොරුන්ගෙන් රට ගලවා ගැනීමට ආ යහපාලන හවුල් නඩයද රට ගෙනගොස් ඇත්තේ කොතනකටදැයි නැවතත් සිතා බැලිය යුතුමය. මහ දවාලේ මහබැංකුව පවා කොල්ලකමින් දූෂණය අතින් ලෝකයෙන්ම 04 වන ස්ථානයට අපේ රට පත්කොට ඇත.

ඉඳින් අප දැන් කුමක් කරමුද? මේ සටහන ලියා තැබුවේ අනේ අපොයි කියා දෑත් නිකටේ රඳවා ගැනීමට නම් නොවේ. ඒ වෙනුවට එළැඹෙන පෙබරවාරියේ දී තරුණ ඔබට පැවරී ඇති සුවිශාල කාර්යයභාරයක් ඇත. වසර 70ක සාම්ප්‍රදායික කතිර වෙනුවට දූෂණය පරදවන, ගම ගොඩනගන බලයක් වෙනුවෙන් ඔබ ඉදිරියට පැමිණිය යුතුය. අප රටේ නව දේශපාලන වෙනසක් වෙනුවෙන් තැබෙන පළමු පියවරට යෝධ ශක්තියක් එක් කරන්නට තරුණ ඔබට හැකි වේවා යැයි FORWARD අපි ප්‍රාර්ථනා කරන්නෙමු...!

### දෙසැම්බර් 13

"ලිංගික අල්ලස් නොදෙමි. ඡන්දය පමණක් ලබාදෙමි. අවස්ථාව දෙනවද?" යනුවෙන් සඳහන් වූ පෝස්ටුවක් බුකිය පුරා වේගයෙන් share වෙමින් තිබුණි. එය ටෙලිනාට්‍ය රංගන ශිල්පිණියක් වන මදූෂා රාමසිංහ විසින් තම Fb පිටුවේ සටහන් කරන ලද්දකි. ඇය ඒකාබද්ධ විපක්ෂය සමඟ සම්බන්ධ වී වැඩ කළ බවත් මහින්ද රාජපක්ෂ මහතාව තමන් ඉතා හොඳින් දන්නා බවත් ඇය සඳහන් කර තිබුණි.

මෙවර පැවැත්වෙන පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා අපේක්ෂකත්වය අපේක්ෂාවෙන් පොදුජන පෙරමුණේ කාර්යාලයට ගිය විට ලිංගික අල්ලස් දෙන්නේ නම් ඇය වෙත එම අවස්ථාව ලබාදෙන බවට පවසා ඇති බව වාර්තා වේ. එසේ ලිංගික අල්ලස් ඉල්ලා ඇත්තේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පොදුජන පෙරමුණේ ඉහළ නායකයෙකු හා එහි ලේකම්වරයකු බව ඇය සඳහන් කර සිටින්නීය. එහෙයින් මෙවැනි සිදුවීම් හරහා පැහැදිලි වන්නේ කුමක්ද? ඉතිහාසයේද වර්තමානයේද එම පක්ෂ විසින් කාන්තාවන්ට




උරුම කර දී ඇති ස්ථානය නොවේද? ඉඳින් එවැනි නායකයින් හා එවැනි පක්ෂ ගැන අපේ රටේ කාන්තාවන්ට විශ්වාස කළ හැකිද? ඔවුන්ගේ ඉතිහාසයන් ගත්තද එය එසේමය. අපේ රටේ ජනගහණයෙන් බහුතරයක් කාන්තාවන්ය. ඉඳින් ඔවුන් දැන්වත් නිවැරදි දේශපාලනය කුමක්ද යන්න තෝරාගත යුතු කාලය එළඹ ඇත.

### දෙසැම්බර් 17

"මේ රටේ හරවත් දේශපාලනයක් කරන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණක්" බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය, සාහිත්‍යවේදී ලියනගේ අමරකීර්ති මහතා විසින් ප්‍රකාශ කළ වීඩියෝවක් බුකිය පුරා දක්නට ලැබුණේය. ඔහු මේ බව ප්‍රකාශ කර තිබුණේ ජ.වි.පෙ. පළාත් පාලන අපේක්ෂකයින්ගේ



ජාතික මහ සමුළුවේ ආරාධිත දේශනයක් සිදුකරන අතරතුරදීය. යටිගිරියෙන් කෑ ගසමින් ජාතිවාදය හෝ ආගම්වාදය වපුරන්නේ නැති, තර්කානුකූලව කරුණු සහිතව තම මතවාදය ඉදිරිපත් කරන්නන් පිරිසක් වුවද ඔවුන්ගේ එම මතවාදයට මේ දක්වා ජනතාවගෙන් වටිනාකමක් ලැබී නොමැති බවද එහිදී ඔහු අවධාරණය කළේය. ඉදිරියේදී පැවැත්වෙන පළාත් පාලන මැතිවරණයේදී ප්‍රධාන පක්ෂ දෙකාහමාරේම අපේක්ෂක ලැයිස්තුවල ඉන්නේත් මහ හොරුන්ගේ දූ පුතුන් හා ඥාතීන්මය. හෙයින් ශ්‍රී ලාංකීය ජාතිය නියෝජනය කිරීමට හැකි තරුණ තරුණියන් ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ලැයිස්තුවල පමණක් බවද එහිදී ඔහු සඳහන් කළේය.

### දෙසැම්බර් 25

"රුසියාව, ශ්‍රී ලංකාවේ තේ තහනම ඉවත් කරයි" යනුවෙන් පළවූ විවිධ පෝස්ටු මුහුණු පොතේ දක්නට ලැබුණි. පසුගිය දා ලංකාවෙන් අපනයනය කළ තේ කොළවල කුරුමිණියෙකු සිටි නිසා අප රටෙන් තේ කොළ ලබාගැනීම රුසියාව විසින් තහනම් කරන ලදී. ලංකාවේ තේ අපනයනයෙන් 25% කට ආසන්න ප්‍රමාණයක් ලබා ගන්නේ රුසියාවයි. මෙයින් කලබලයට පත් වූ ආණ්ඩුව මේ සඳහා විවිධ පැහැදිලි කිරීම් මාධ්‍ය හරහා සිදු කරනු ලැබීය. අවසානයේ දී සමහර ඇමතිවරු පැවසූයේ ලංකාව විසින් ඇස්බැස්ටෝස් තහනම් කළ නිසා



තේ අපනයනය තහනම් කරන්නට ඇති බවයි.

ඇස්බැස්ටෝස් තහනම් කළේ එහි මිනිස් ශරීරයට අහිතකර පිළිකාකාරක ඇති බැවිනි.

කෙසේනමුත් ඉන්පසුව ඇස්බැස්ටෝස් තහනමද ආණ්ඩුව විසින් ඉවත් කරගන්නා ලදී. අනතුරුව තහනම් වූ තේ අපනයනයත් රුසියාව විසින් ඉවත් කරගන්නා ලදී. අවසානයේ දී සිදු වූයේ කුමක්ද? රුසියාවට කුරුමිණියෝ අදාළ වුනෙත් නැත, ලංකාවට පිළිකාකාරී ඇස්බැස්ටෝස් අදාළ වූයෙත් නැත. රුසියාව තමන්ට අවශ්‍ය වූ දේ හොඳින් හෝ නරකින් ඉටු කරගන්නා ලදී. නමුත් ලාංකීය ජනතාවගේ ජීවිතවලට සිදුවන හානිය ගැන ආණ්ඩුවට වගේ වගක් නැතිව ගියේය.

### දෙසැම්බර් 26

මීට වසර 13කට පෙර අද වැනි දවසක් පිළිබඳ වේදනාකාරී මතකයන් රැගත් විවිධ පෝස්ටු බුකිය පුරාම share වී තිබුණා. ඒ 2004 දෙසැම්බර් 26 දින මුළුමහත් ශ්‍රී ලාංකික ජනයාගේ හදවත් කම්පාවට පත්කරවමින් පැමිණි සුනාමි දල රළ පෙළ ගැනයි. එයින් ජීවිත හතලිස්දහසකට



අධික ප්‍රමාණයක් හා අතිවිශාල දේපළ ප්‍රමාණයකුත් රටට අහිමි විය. සාමාන්‍ය ජන ජීවිතය කිසිවක් කරකියා ගැනීමට නොහැකිව අසරණ විය. රාජ්‍ය යාන්ත්‍රණය මුළුමනින්ම බිඳ වැටුණි. මේ විනාශය සිදුවී පැය කිහිපයක් යන්නට මත්තෙන්ම ජ.වි.පෙ. රතු තරුව සහන සේවා බලකාය ක්‍රියාත්මක විය. එහි සාමාජිකයෝ දස දහස් ගණනින් රට වටා සුනාමි ව්‍යසනයන් වූ ස්ථාන කරා යෙදවුහ. සම්පූර්ණයෙන්ම විනාශ වී ගිය කොළඹ - මාතර දුම්රිය මාර්ගය දින 57 න් යථා තත්වයට පත් වූයේ රතු තරුව තුළ වූ අප්‍රතිහත ධෛර්යය නිසාවෙනි. ඒ ගැන එසේ පළවෙද්දී තවත් පෝස්ටු කිහිපයක් ද දැකගත හැකි විය. ඒ හිටපු ජනාධිපතිවරයා විසින් විදෙස් රටවලින් ලැබුණු සුනාමි අධාර මුදල් වංචා කිරීමේ සිදුවීම ගැන පළවූ පොස්ටුය. ඉඳින් කොතරම් දේශප්‍රේමී සළුපිළි පොරවා ගත්තද සැබැවටම ජනතාවට ආදරය කරන්නේ කවුරුන්ද යන වග මෙයින්ම ජනතාවට වැටහෙනු ඇත.

ලිංගිකත්වය පිළිබඳව

ලිංගාශ්‍රිත රෝගයක් ඇති දැයි හඳුනාගන්නේ කෙසේද? එසේ ඇත්නම් ඔබ කළ යුත්තේ කුමක්ද? පසුගිය කලාපයෙන් අපි කතා කළේ ලිංගාශ්‍රිත රෝග පිළිබඳ මූලික කරුණු කීපයක්. මෙවර ලිපියෙන් ඔබට මේ පිළිබඳව තවදුරටත් දැනුවත් වීමට පුළුවන්.

දිනක් වාට්ටුවේදී මට තරුණියක් මුණගැසුණා. ඇය පිටරටක ගෘහ සේවිකාවක් ලෙස මීට මාස කීපයකට පෙර සේවය කරද්දී එම නිවසේ හිමිකරු අතින් ලිංගික අපචාරයකට ලක් වෙලා. වරක් දෙවරක් නොවෙයි, මාස කීපයක්ම මෙලෙස ඇයව අපචාරයේ යොදාගනු ලැබ තියෙනවා. ඇගේ යෝනි මාර්ගයේ තදබල දැවිල්ලක් හා තුවාල ඇති බව පැවසුවා. ඇයට උණ වැළඳී තිබූ අතර අධික ලෙස බිය වී කලබලකාරීව හැසිරුණා. එහිදී වහාම අප රෝහලේ ලිංගාශ්‍රිත රෝග සායනය වෙත යවා ඇයට ප්‍රතිකාර ලබා දුන්නා. මෙවැනි අවස්ථා බොහෝමයකට මා වෛද්‍යවරියක් ලෙස මුහුණ දී තිබෙනවා. ඒ නිසා අපි අද ලිංගාශ්‍රිත රෝගවල රෝග ලක්ෂණ ආදිය පිළිබඳව කතාකරමු.



වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි

# සිතට බිය ගෙනෙන ලිංගාශ්‍රිත රෝග

**වෛද්‍යතුමනි, ලිංගාශ්‍රිත රෝගවල රෝග ලක්ෂණ මොනවාද?**

මෙම රෝගවල ලක්ෂණ ප්‍රධාන ලෙස තුන් ආකාරයකට බෙදන්න පුළුවන්. ලිංගේන්ද්‍රිය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල තුවාල ඇති වීම (ලිංගික හර්පීස් හා ප්‍රාථමික උපදංශය), ලිංගේන්ද්‍රියෙන් අසාමාන්‍ය ලෙස ශ්‍රාව නිකුත් වීම (ගොනෝරියාව, ගොනෝරියා නොවන මුත්‍රා ප්‍රදාහය, ට්‍රෛකොමොනයසිස්) හා ලිංගේන්ද්‍රිය හා ඒ අවට ගැටිති මතුවීම (ලිංගික ඉන්නන්). අනාරක්ෂිත ලිංගික එකතු වීමකින් පසුව මෙවැනි රෝග ලක්ෂණ මතු වුවහොත් ඔබ වහාම ප්‍රතිකාර ලබාගත යුතුය.

**මෙම ලිංගාශ්‍රිත රෝග එකින් එක කෙටියෙන් විස්තර කළහොත්..?**

ලිංගික හර්පීස්වලදී රහස් ප්‍රදේශවල බිබිලි ඇතිවීම, ඒවා කැඩීගොස් වේදනාකාරී තුවාල ඇතිවීම, උණ ඇතිවීම සිදුවේ.

උපදංශයේදී මාස තුනක් වැනි කාලයකදී වේදනා රහිත ගැඹුරු තුවාල , කුද්දැටි ඉදිමීම සිදු වන අතර බෙහෙත් නොගතහොත් කටේ තුවාල ඇතිවීම, උණ ඇතිවීම, සමේ දද මතුවීම ලෙස ද්විතීයික රෝග ලක්ෂණ මතුවීම සිදුවේ. එසේම පසු උපදංශ අවස්ථාව රෝගී ලක්ෂණ නොපෙන්වන තත්වයකි.

ගොනෝරියා රෝගයේදී ලිංගේන්ද්‍රියෙන් ශ්‍රාව පිටවීම, මුත්‍රා දැවිල්ල, නිතරම මුත්‍රා පිටවීම, යටිබඩ කැක්කුම හා වෘෂණ කෝෂවල කැක්කුම ඇති වේ.

ලිංගික ඉන්නන් ඇති වීම මාස 6කේ පමණ කලක් ඇතුළත සිදුවිය හැක. විවිධ හැඩයෙන් හා ප්‍රමාණයෙන් යුතු ගැටිති විවිධ ක්‍රම මඟින් ඉවත් කළ හැක. නමුත් කාන්තාවන්ගේ නම් ගැබ්ගෙල පිළිකා සෑදීමේ අවධානම ඇති නිසා වසරකට වරක් පැප් පරීක්ෂාවකට ලක්වීම වැදගත් වේ.

මීට අමතරව හෙපටයිටිස් බී රෝගය ද ඇතිවිය හැකියි.

**ලිංගාශ්‍රිත රෝග නොවන, ලිංගිකව බෝවන රෝග ලෙස නොසැලකෙන රෝග මොනවාද?**

ඒවායේ රෝග ලක්ෂණ ලිංගික රෝගවල ලක්ෂණවලට සමාන නිසා බොහෝදෙනා අධික මානසික පීඩනයකින් පසුවෙනවා. මෙම රෝග අප සමාජයේ ඉතාම බහුලයි. ඒවා ඇතිවීමට ලිංගිකව එක්වීම අත්‍යවශ්‍ය නැත. විවාහක අවිවාහක ඕනෑම අයෙකුට වැළඳිය හැකිය. නමුත් සමහරුන්ගේ මේ පිළිබඳව ඇති වැරදි ආකල්ප හා නොදැනුවත්කම නිසා විවාහ ජීවිත දෙදරා යන අවස්ථාත් දකින්න පුළුවන්. ප්‍රධාන ලෙසම දිලීර (පුස්) රෝග හෙවත් ටිනියා රෝගය හා කැන්ඩිඩා රෝගය හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන් පිරිසිදුකම අඩුවීම, ලිංගික පෙදෙස් තෙත්ව තිබීම, යට ඇඳුම් පිරිසිදුව තබා නොගැනීම, සමීප අයෙකුට වැළඳී ඇත්නම් ස්පර්ශය ආදියෙන් බෝවෙන්න පුළුවන්. පිරිමි අයගේ නම් රතු හා සුදු ලප, කැසීම, ඉරිතැලීම, ලිංගිකව එක්වීමක දී දැවිල්ල වැනි රෝග ලක්ෂණ ද කාන්තාවන්ගේ නම් සුදු කැටිති ලෙස යෝනි මාර්ගයෙන් ශ්‍රාව නිකුත් වීම, කැසීම, දැවිල්ල ඇතිවීම සිදුවිය හැක. මෙහිදී රෝග ලක්ෂණ මතු වූ අයට පමණක් ඖෂධ ලබා දේ. වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට පැකිලිය යුතු නැත. මෙය කිසිවිටක බියවිය යුතු තත්වයක් නොවේ. ප්‍රතිකාර මඟින් නිට්ටාවටම සුව වන, ඉතාම සුලභව සෑදෙන රෝග තත්වයකි.

**මෙම රෝගයට අමතරව සමාජ රෝග ලෙස නොසැලකෙන තවත් රෝග තිබෙනවා. ඒ මොනවාද?**

විවිධ කෑම බීම හා ඖෂධවලට ඇතිවන ආසාත්මිකතා නිසා ඇතිවන කැසීම් මේ අතර වෙනවා. බැක්ටීරියල් වැජිනොසිස් කියන රෝගයේදී කැසීමක් හෝ දුර්ගන්ධයක් සහිත ශ්‍රාවයක් පිටවීම සිදුවිය හැක. මෙයට විවිධ හේතු ඇත. ලිංගික ප්‍රදේශවල ඇතිවන ගැටිති තත්ව ලෙස පිරිමි අයගේ පිනයිල් පැපිලි හා දෙපාර්ශවයටම පොදුවේ ස්වේද ග්‍රන්ථි ආශ්‍රිතව ඇතිවන ගැටිති හැඳින්විය හැක. මෙය සාමාන්‍ය අයෙකුට වෙන්කර හඳුනාගත නොහැකි නිසා වෛද්‍යවරයෙකු මඟින් පරීක්ෂා කරවාගත යුතුයි. නිසි ප්‍රතිකාර ලබාගත යුතුයි.

**ලිංගාශ්‍රිත රෝගයක් වැළඳී ඇත්දැයි දැනගන්නේ කෙසේද ? දැනගත් පසු කළ යුත්තේ කුමක්ද?**

මෙවැනි රෝග ලක්ෂණ මතුවූ විට වෛද්‍යවරයෙක් ලවා පරීක්ෂා කරවාගත යුතුයි. එසේම ලිංගාශ්‍රිත රෝග සායනයකට යා යුතුය. එහිදී ඔබේ රහසිගතභාවය සුරැකෙන අතර ඔබගේ රහස් පෙදෙස් පරීක්ෂා කරනවාට අමතරව ලේ පරීක්ෂණ, ශ්‍රාව පරීක්ෂණද සිදු කෙරේ. රෝග-යන්හි මුල් අවස්ථාවලදී සායනයකට යෑම වඩා වැදගත් වේ. එවිට සංකූලතා අවම කරගත හැක. නිසියාකාරව ඖෂධ ලබාගත යුතුය. ඔබට පමණක් නොව ඔබ සමඟ ලිංගිකව එක් වූ අනෙකුත් අයද යොමු කරවිය යුතුය. ඒ ඔවුන්ටද ඒවා වැළඳී තිබෙන්නට පුළුවන් නිසාය. විශ්වාසවන්ත එක් සහකරුවෙක් / සහකාරියක් සමඟ ලිංගික කටයුතු සිදු කිරීම මඟින් මෙම රෝග ඇතිවීම අවම කරගත හැක. කෙටි කලක සුවයක් වෙනුවෙන් හැඟීම්වලට යටත් වී කරන ක්‍රියා නිසා ජීවිතයම අඳුරු විය හැක.

ඒඩ්ස් වැනි භයානක රෝග පිළිබඳව ඉදිරි ලිපිවලදී කතා කරමු!.


සටහන: වෛද්‍ය රිසිනි විල්මා

**ලිංගික රෝග පිළිබඳව ඔබට ඇති ප්‍රශ්න, ගැටලු අපට යොමු කරන්න.**
**Forward පුවත්පත, 464/20,**
**පන්නිපිටිය පාර, පැලවත්ත,**
**බත්තරමුල්ල.**



# පවුරුවලින් එහා...









## DANGAL

සයුර නම් සුවිසල්ය. ගිරිශිඛර, නදී දොළ, නෙක උයන් විසිතුරුය. මේ සුන්දරත්වය විඳීමට නම් එහි සැරිසැරිය යුතුමය. දසුන් පථයට එපිට නිම් නොවූ ලෝකය දැකීමට-ඇසීමට-විඳීමට කඩතුරා බිඳ ඉදිරියටම යා යුතුය. එසේම ජීවිතය දිනීමට ද සටන් කළ යුතුමය. ගීතා හා බබීතා ද එසේමැයි! ඔවුහු මෙතෙක් සංස්කෘතිය නම් රාමු මුවාවෙන්, ධනවාදී සමාජය විසින් ඉවුම්-පිහුම්-වැදුම් කටයුතුවලට වෙන්කර තැබූ සාම්ප්‍රදායික ඉන්දියානු කතගේ නිම්වළලු බින්දෝය. අතිදක්ෂ මල්ලවපොර ක්‍රීඩිකාවන් ලෙසින් ගීතා හා බබීතා දංගල් චිත්‍රපටය තුළින් සමාජයේ කාන්තාව පිළිබඳව වන පසුගාමී මතවාදයන් සමඟ සටන් කරමින් සිටී.

සත්‍ය කතාවක් ඇසුරෙන් 2016 දී තිරගත වුණු දංගල් (Dangal) චිත්‍රපටය බොලිවුඩ් සිනමාව තුළ වාර්තා පිට වාර්තා තබමින්, හොඳම චිත්‍රපටයට, හොඳම චිත්‍රපට අධ්‍යක්ෂණයට, හොඳම නළුවාට හිමි සම්මාන ඇතුළු සම්මාන රැසක් දිනාගත් අතර එය හොඳම නළුවාට හිමි සම්මානය දිනූ අමීර් ඛාන්ගේ නිෂ්පාදනයකි. අධ්‍යක්ෂණය නිමේෂ් තිවාරි විසිනි.

ගීතා හා බබීතාගේ පියා පෝගට්ය. වරක් ඔහු ගැන දැරිවියන්ගේ මිතුරියක් මෙසේ පැවසීය.

"..ගෑණු ළමයෙක් ඉපදුණාම එයාට උගන්නනවා, උයන-පිහන හැටි. ගෙදරදොර වැඩ ඔක්කොම කරව ගන්නවා. වයස 14ක් වුණ හැටියෙ කසාද බන්දනවා. එයාලගෙ ජීවිතේ බාරදෙනවා කවදාවත්ම දැකල නැති මනුස්සයෙකුට.. ඔයාලගෙ තාත්තා අඩුම ගානෙ ඔයාලා එයාගෙ ළමයි හැටියටවත් සලකනවා. එයා මුළු ලෝකයත් එක්කම සටන් කරනවා, ඔයාලා දෙන්නට හොඳ අනාගතයක් හදාගන්න පුළුවන් වෙන්න.."

පෝගට් ද මල්ලවපොරයේ අතිදක්ෂයෙකි. ආර්ථික අපහසුතා අභිමුව සිය ක්‍රීඩා දිවියට අකාලයේ සමුදීමට සිදුවුව ද ජයග්‍රහණය පිළිබඳ සිහින දැකීම ඔහු අත්හළේ නැත. සමාජයේ නොයෙක් ගර්ජනා මැද, ක්‍රීඩාව කිසිඳු දිරියක් නොලබන වටපිටාවක් තුළ ඔහු සිය දැරිවියන් දෙදෙනා පිටියට ගෙන එන්නේ එවන්ම වූ සිහිනයක ප්‍රතිඵලයක් ලෙසිනි.

සාම්ප්‍රදායික ජීවන රටාවට අනුගතව, ජීවිතයේ වෙනසක් පිළිබඳව හෝ තම මානුෂීය අයිතීන් පිළිබඳව හෝ කිසිඳු අපේක්ෂාවක් නොවූ ඉන්දියානු කාන්තාවට ජීවිතය පිළිබඳව සිතීමට නවමු මඟක් එළිපෙහෙළි කළ සාර්ථක වූත් ප්‍රගතිශීලී වූත් නිර්මාණයක් ලෙස දංගල් චිත්‍රපටය හැඳින්විය හැකිය.

ඉතිරි... 11 පිටුවෙන්

## සිහින සැබෑ කරගැනීම...

බණ්ඩාරනායක හා ලෙස්ටර් ජේම්ස් පීරිස් වැනි කලාකරුවන් හඳුන්වා දිය හැකියි.

**කලාකරුවාද ඇතුළුව අපේ රටේ තාරුණ්‍යය මුහුණ දෙන අභියෝග ගැන ඔබට තිබෙන්නේ කවර හැඟීමක්ද?**

ඇත්තටම කිව්වොත් අද ජීවත් වීම පවා අභියෝග යක්. ඒ වගේම කලාකරුවෙකුට නිර්මාණයක් කිරීමට අවශ්‍ය පුහුණුවීම් කරන්න, හැදෑරීමක් කිරීමට පවා අභියෝගයක් වෙලා. ඔවුන්ට නිර්මාණ කිරීම පසෙකට දාලා ජීවන අභියෝගයට මුහුණ දීමට සිදු වී තිබෙනවා. මේ හේතුව නිසාම ඔවුන් සංක්‍රමණ කලාකරුවන් බවට පත් වී තිබෙනවා. හොඳ කලා නිර්මාණයක් බිහිවීමට නම් එම කලා නිර්මාණයට අදාළව සියලුම කලාකරුවන් එක පවුලක් බවට පත්විය යුතුයි. සමස්ත නිර්මාණය තුළම ජීවත් විය යුතුයි. නමුත් මේ තිබෙන වටපිටාවේ එවැනි දෙයක් කළ නොහැකියි. පොදුවේ ගත්තාම රටේ ජීවත් වන තරුණයාත් ශිෂ්‍යයාත් අභියෝගවලින් පිරුණු බලාපොරොත්තු රහිත තත්වයකට පත් වෙලා.

**ඔබගේ අනාගත බලාපොරොත්තු මොනවාද?**

මගේ අනාගත බලාපොරොත්තුව තමයි හොඳ රංගන ශිල්පිනියක් වීම සහ හොඳ චිත්‍රපට අධ්‍යක්ෂකවරියක් වීම.

**ඔබට අපේ රටේ තරුණයයට ලබා දීමට ඇති පණිවිඩය කුමක්ද?**

ඔබ සිහින දකින්න. හැබැයි සැබෑ කරගන්න හැකි සිහින පමණක්. ෆැන්ටසි මවන යථාර්ථවාදී නොවන සිහින නොදකින්න. ඔබ දකින යථාර්ථවාදී සිහින සැබෑ කරගැනීම සඳහා අරගල කරන්න.

## අද වාණිජ කලාවට...

කලා ජීවිතයේ ලොකු වෙනසක් වෙන්නෙ නැහැ. සම්මානයක් ලැබුණු සතුට තියෙනවා. මාසයක් විතර යනතුරු මිනිස්සුන්ට මතක තියෙනවා. සුබ පතනවා. එච්චරයි. එතනින් එහාට සම්මානවලින් ලැබුණු දෙයක් නැහැ. මම කළ කැපකිරීම, මහන්සිය වෙනුවෙන් ලැබුණු සම්මානයක් නිසා සතුටුයි. නමුත් සම්මානනීය නිළියක් කියලා කවුරුවත් ඇවිත් නාට්‍යයකටවත් චිත්‍රපටයකටවත් කතා කරන්නේ නැහැ. මේක මට විතරක් නෙවෙයි, කාටත් පොදුයි.

**සමාජ මතයක් ගොඩනැගීම සඳහා කලාව කොයිතරම් දුරට ප්‍රයෝජනවත්ද?**

කලාකරුවෙක් නිර්මාණයක් කරන්නෙ සමාජ මතයක් ගොඩනැගීමට තමයි. නමුත් ඒ කලා නිර්මාණය ප්‍රේක්ෂකයන් විසින් කොයිතරම් දුරට භාරගන්නවද කියන එක තමයි ඊළඟ ගැටලුව වන්නේ. එක් එක් ප්‍රේක්ෂකයින්ගෙ බුද්ධි මට්ටම අනුව තමයි ඔවුන් ඒවා ග්‍රහණය කරගන්නෙ.

**කලාකරුවාත් ඇතුළුව අපේ රටේ තාරුණ්‍යය මුහුණ දෙන අභියෝග ගැන ඔබේ අදහස කුමක්ද?**

කලාකරුවෙක් කලා නිර්මාණයක් කරන්නෙ ඉතාමත් අමාරුවෙන්. නාට්‍යයක් ගත්තොත් පිටපත රචනා කරන තැන ඉඳන් ඒක එළිදක්වන තැන දක්වාම විශාල අභියෝග රාශියකට මුහුණ දෙන්න වෙනවා. වෙන රටවල නම් කලාකරුවන්ට තමන්ගේ නිර්මාණ එළිදක්වන්න ඕනතරම් අවස්ථා තිබෙනවා. ඒත් අපේ රටේ කලාකරුවෙකුට නාට්‍යයක් එළිදක්වන්න තියෙන්නේත් රාජ්‍ය නාට්‍ය උළල හා යෞවන නාට්‍ය උළෙල විතරයි. එතනින් එහාට, "හොඳම නාට්‍ය" වුනත් ඒක පවත්වාගෙන යන්නේ කොහොමද කියන ගැටලුව තියෙනවා. රියසල් කරන්න තැනක් නැහැ. නාට්‍යයකට වැයවන මුදල අපි කොහොමද සපය ගන්නේ යනාදී ගැටලු රාශියක් මධ්‍යයේ තමයි නිර්මාණකරුවෙක් තමන්ගේ නිර්මාණ ගොඩනගන්නේ සහ පවත්වාගෙන යන්නෙ. රජයෙන් හෝ වෙනත් අංශවලින් හෝ කිසිම සහයෝගයක් ලැබෙන්නේ නැහැ. අපිම මහන්සි වෙලා වියදම් කරගෙන තනියම කරගන්න ඕන දෙයක් විදියටයි තියෙන්නේ.

**ඔබට මේ රටේ තාරුණ්‍යයට ලබා දෙන්න තිබෙන පණිවිඩය කුමක්ද?**

විශේෂ පණිවිඩයක් නැහැ. කලා ක්ෂේත්‍රයට පිවිසෙන්න ඉන්න අයට හැකි විදියෙන් උදව් කරන්න කැමතියි. ඒ නිසා ඔවුන්ට කියන්න තියෙන්නේ, නව නිර්මාණ කරන්න, ආරම්භයක් තබන්න කියලයි.

## සරදියෙල්ගේ කොලම

*අවුරුදු ගාණකට පස්සේ පළාත් පාලන ඡන්දයක් ඇවිල්ලා. ඒකත් තව තව කල් දාන්න සමහොරු පෙත්සම් ගැහුවා. හොරකම් කරපු සහ කරන එව්වෝ ඡන්දවලට බයයි. මොකද මිනිස්සුන්ට මුහුණ දෙන්න ඒ අයට බෑනේ. පොහොට්ටු පුප්පන්න ආපු මහ රජු සහ හොරු සෙට් එකට හරියකට නාම යෝජනාවක්වත් දී ගන්න බැරුව ගියා. ඇයි ඉතින් එතනත් හොරකමනේ. සෑම පක්ෂයකම වාගේ නාමයෝජනා තැන් තැන්වල හුළඟේ ගහගෙන යද්දි ජ.වි.පෙ. නාමයෝජනා නම් නියමෙට බරට තිබ්බා. දොස්තරලා, ගුරුවරු වගේ සමාජයේ පිළිගත් වැදගත් කට්ටියගෙන් වගේම අවංක මිනිසුන්ගෙන් තමයි ඒවා බරටම පිරිලා තිබ්බේ. ලිංගික අල්ලස් ඉල්ලපු පොහොට්ටු පිපෙන්නටත් කලින් පරවෙලා යද්දි සිංහල, දමළ, මුස්ලිම් සෑම ජන කණ්ඩායමක්ම නියෝජනය කරන දක්ෂ කාන්තාවන්ගෙන් ජ.වි.පෙ. නාමයෝජනා පිරිලා තිබුණා.*

*අධිරාජ්‍යවාදීන් අපේ රට දාලා ගිහිල්ලා අවුරුදු 70ක් පිරෙන 2018 අවුරුද්දේ පෙබරවාරි 10 කියන්නේ සරදියෙල්ට බොහොම විශේෂ දවසක්. සුද්දාවත් ලංකාවට කරපු නැති තරම් විනාශයක් අවුරුදු 70ක් තිස්සේ මේ කලු සුද්දෝ ටික රටට කරලා තියෙන්නේ. ඒ නිසා ඒකට රිටර්න් එක දෙන්න පුළුවන් දවස තමයි පෙබරවාරි 10 කියන්නෙ. උතුවන්කන්දේ මගේ ගම විතරක් නෙමෙයි, මේ ලංකාවෙම ගම්මාන පාලනය කිරීමේ බලය අවංක මිනිස්සු ටිකක් අතට දුන්නා නම්, ඒක තමයි මේ කට්ට හොරුන්ට දෙන්න පුළුවන් හොඳම දඬුවම.*

*මේ පෙබරවාරි 14 වෙනිදාට අපේ රටේ කෙල්ලෝ කොල්ලෝ වැලන්ටයින් සමරන්නේ, ආදරයේ පැහැය වෙච්ච රතු පාට හැම ගමක් නගරයක් පුරාම දිනවලා කියලා නම් සරදියෙල්ට හොඳටම විශ්වාසයි.*

**නූතන සරදියෙල්**

# ආණ්ඩුවත් එක්ක ඩීල් දාන "ඩෝල්" වල ඇත්ත

ජලපෝෂක වනාන්තර බිම් හා ගොවි බිම් විනාශ කරමින් සීමාසහිත ඩෝල් ලංකා පුද්ගලික සමාගම විසින් මෙරට වියළි කලාපය තුළ ස්ථාන ගණනාවකම නීතිවිරෝධී ලෙස ඉඩම් කොල්ලයක් සිදුකරමින් සිටී. මෙම නීතිවිරෝධී ඉඩම් අත්පත් කරගැනීමට විරුද්ධව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණ නියෝගයක් ද ලබාගෙන තිබේ. එහෙත් එම නියෝග පවා අත්හිටුවා, නැවත එම ඉඩම් අදාළ සමාගම වෙතම ලබා දීමට වත්මන් ආණ්ඩුව සැලසුම් සකස්කරමින් ඇත.

එහි පළමු පියවර ලෙස මෙම ඉඩම් ලබා දීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබේ. ඒ සඳහා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා විසින් 2016.09.15 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක සී.පී 16/1934/752/023 යටතේ "සී/ස ඩෝල් ලංකා පෞද්ගලික සමාගම නමින් මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩාඔය සහ දෙමෝදර පිහිටි කෙසෙල් වගා කරනු ලැබූ ඉඩම් නියමානුකූල කිරීම" මැයෙන් කැබිනට් මණ්ඩලය වෙත ලිපියක් ඉදිරිපත් කර තිබේ. එම ලිපිය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා වශයෙන් ජනාධිපතිවරයාගේ මෙන්ම ඉඩම් හා මුදල් අමාත්‍යවරුන්ගේ ද නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.

කිසියම් සමාගමක් වෙත ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ඉඩම් නිදහස් කරනු ලබන්නේ එම ව්‍යාපෘතිය පිළිබඳව සිදුකරන ඉල්ලීමකට අනුව එහි ශාක්‍යතාව අදාළ රාජ්‍ය ආයතන විසින් පරීක්ෂා කර අනුමැතිය ලබාදුන්නේ නම් පමණි. එම අනුමැතීන්ට යටත්ව රජයේ ඉඩම් ආඥා පනතේ 199 (උ) වගන්තියට අනුව දීර්ඝ කාලීන බදු ගිවිසුමක් යටතේ ඉඩම් අමාත්‍යවරයාගේ හා ජනාධිපතිවරයාගේ නිදේශ මත ඉඩම් නිදහස් කිරීමේ හැකියාව ඇත.

කිරිදි ඔයේ ජලය නීති විරෝධීව මහ පරිමාණ ඩෝල් වගා බිම් වලට ලබා ගන්නා ආකාරය



රජයේ ඉඩම් ලබා දීමේ ක්‍රියාපටිපාටිය මෙය වුව ද ඩෝල් සමාගමට එසේ ලබා නොදීමට කරුණු කිහිපයක් බලපා තිබේ. ඒ එම සමාගම, නීතිවිරෝධීව වසර ගණනාවක් මුළුල්ලේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පරිහරණය කිරීම හා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම කිසිදු අනුමැතියකින් තොරව ඉඩම් අවභාවිතා කර තිබීම හේතුවෙනි. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පෙර සඳහන් කැබිනට් පත්‍රිකාවේ සඳහන් වූ එම සමාගමේ කුඩාඔය සහ දෙමෝදර පිහිටි නීති විරෝධී වගා බිම්වලට එරෙහිව වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණය මඟින් නීතිමය ක්‍රියාමාර්ග ද ගෙන තිබේ.

එපමණක් නොව, මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩාඔය හා දෙමෝදර පිහිටි ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යාන මායිමේ ව්‍යාප්ත කර ඇති කෙසෙල් වගා බිම්, 2009 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1973 අංක 02 දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 09 වන වගන්තිය ද සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කර ඇත.

එසේම 2009 අංක 65 දරන පනතින් අවසන් වරට සංශෝධිත, 1907 අංක 06 දරන වන සංරක්ෂණ ආඥා පනතේ 20 වන වගන්තිය පවා උල්ලංඝනය කරමින් ඩෝල් සමාගම විසින් රජයට අයත් වනාන්තර එළිපෙහෙළි කරමින් වගා බිම් ස්ථාපිත කර තිබේ. එම වගන්තියට අනුව වනාන්තර එළිපෙහෙළි කිරීම, ශාක කපා ඉවත් කිරීම, වගා බිම් ස්ථාපිත කිරීම නීති විරෝධී ක්‍රියාවන්ය. එවන් ක්‍රියාවල නිරත වන අයෙක් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයකට ඉදිරිපත් කළ හැකි අතර ඉන් වරදකරුවකු වුවහොත් වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් 5000 ත් 50000 ත් අතර දඩයකට හෝ මෙම දඬුවම් දෙකටම හෝ යටත් කළ හැකිය.




මේ අතර 1980 අංක 47 දරන සංශෝධිත ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1993 ජූනි 24 දින අංක 772/22 දරන ගැසට් නිවේදනයට අනුව හෙක්ටයාර එකකට වැඩි වනාන්තර ප්‍රදේශයක් එළිපෙහෙළි කර යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් පාරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියකට යටත්ව පූර්ව ලිඛිත පාරිසරික අනුමැතියක් ලබාගත යුතුය.

එසේම 1940 අංක 09 දරන සංශෝධිත පුරාවස්තු ආඥා පනතේ 23 (අ) සහ 47 වගන්තිවලට අනුව 2000 ඔක්තෝබර් 04 දින ප්‍රකාශිත අංක 1152/14 දරන ගැසට් නිවේදනයට අනුව හෙක්ටයාර දෙකකට වඩා වැඩි භූමියක් එළිපෙහෙළි කිරීමට ප්‍රථම පුරාවිද්‍යා හානි ඇගයීමක් සිදුකර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතුය.

ඒ අනුව වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත, වන සංරක්ෂණ අඥාපනත, ජාතික පාරිසරික පනත හා පුරාවස්තු අඥාපනත මෙන්ම රජයේ ඉඩම් ආඥා පනත ද උල්ලංඝනය කරමින් ඩෝල් සමාගම, නීති විරෝධීව වගා බිම් ස්ථාපිත කර ඇති බව තහවුරු වේ. එසේ තිබියදීත් එම ඉඩම් නැවතත් ඩෝල් සමාගමට ලබා දීමට නීතිපති දෙපාර්තමේන්තුව හා ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලය ඉතා නිර්ලජ්ජිත උත්සාහයක නිරතව සිටී. එසේම මෙය රටේ නීතියේ ආධිපත්‍යය තඹයකට මායිම් නොකර, අනාගතය සඳහා ලබාදෙන වැරදි පූර්වාදර්ශයකි.

කෙසේවුවද මෙම බලාධිකාරයන්ගේ ආනුභාවයෙන් අදටත් මොනරාගල දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය ආශ්‍රිතව ඉඩම් අක්කර 4600 ක් අත්පත් කරගනිමින් කැවැන්ඩිස් කෙසෙල් වගාව අඛණ්ඩව සිදු කරයි. මීට අමතරව තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නිකවැව ග්‍රාමනිලධාරී වසමේ පිහිටි මීගස්වැව ප්‍රදේශයේ ඉඩම් අක්කර 1400ක් ද මොනරාගල, කොටියාගල ප්‍රදේශයේ තවත් අක්කර 5000ක් ද මෙම සමාගමට ලබාදීමට සූදානම්ය.

එසේම වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුඩාඔය ප්‍රදේශයේ අක්කර 1800ක්, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන්දම, දෙමෝදර ප්‍රදේශයේ අක්කර 1600ක් 04 පිටුවට >>

## The Gadget

# අන්තර්ජාලය අධිවේගවත් කරන කාල දුරේක්ෂය හෙවත්

# TIME TELESCOPE



ඔබ දැනටමත් දන්නවා ඇති අන්තර්ජාලය හරහා දත්ත රැගෙන යාමට භාවිතා වන අලුත් ක්‍රමය ෆයිබර් ඔප්ටික් කේබල් කියලා. නමුත් මීට පෙර තඹ කේබල් (කොපර් කේබල්) හරහා තමයි අන්තර්ජාලයේ දත්ත රැගෙන ගියේ. ඒ ක්‍රමය හරහා දත්ත (ඩේටා) රැගෙන යාමේ වේගය ඉතාම අඩුයි. එහෙත් ලෝකයේ තාක්ෂණය දියුණු වීමත් සමඟම කාර්යක්ෂමතාවය ඉතාමත් වැඩි වුණා. ඒ නිසාම මිනිසුන්ට අවශ්‍ය වුණා ඊට වඩා වේගයෙන් දත්ත ගමන් කළ හැකි මාධ්‍යයක් හොයාගන්න. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි ෆයිබර් ඔප්ටික් තාක්ෂණය එන්නේ.

ෆයිබර් ඔප්ටික් කේබල් හරහා දත්ත ගමන් කරන වේගය ඉතාමත් වැඩි වුණා. එහි වේගය මනින්නේ GB වලින්. GB කියන්නේ ගිගා බයිට් (Giga Byte) නෙවෙයි, ගිගා බිට් (Giga Bit) කියන එකයි. මිට පෙර තිබුණු තාක්ෂණයේ වේගය මැන්නේ මේගා බයිට්වලින් (Mega Byte). දැන් තේරෙනවනේ ෆයිබර් ඔප්ටික් තාක්ෂණය කොච්චර වේගවත්ද කියලා.

නමුත් ඊටත් වඩා වේගයෙන් දත්ත රැගෙන යා හැකි අලුත්ම ක්‍රමයක් දැන් හොයාගෙන. ඒක හරියට කාචයකින් ආලෝකය හකුළුවා එකතු කරන්නාක් වගෙයි. එහිදි ෆයිබර් ඔප්ටික් කේබල් තුළින් ගමන් කරන තොරතුරු හකුළුවා ගන්නවා. ඒ නිසා ෆයිබර් ඔප්ටික් කේබල් ජාලයකින් තත්පරයට මීටර් මිලියන 200ක වේගයෙන් දත්ත හුවමාරු කරගන්න පුළුවන්. ඒ කියන්නේ දැන් තිබෙන වේගයට වඩා විසිපස් ගුණයකින් වේගය වැඩිවෙනවා. මේ තාක්ෂණය සොයාගෙන තියෙන්නේ ඇමෙරිකාවේ කෝනෙල් විශ්වවිද්‍යාලයේ මාක් ෆොස්ටර් ඇතුළු පර්යේෂක කණ්ඩායමයි.

අන්තර්ජාලය තුළ දත්ත හුවමාරු වන්නේ ඩේටාග්‍රෑම් (datagram) හෙවත් පැකට් වශයෙන්. ෆයිබර් ඔප්ටික් කේබල් තුළදී ඩේටාග්‍රෑම් එකක් නිරූපණය වන්නේ ආලෝක තරංගවලින්. ආලෝක තරංග තුළ ඇති අපට පෙනෙන නොපෙනෙන විවිධ වර්ණ නම් කරන්නේ ඒවායේ තරංග ආයාමයෙන් හෙවත් බෑන්ඩ්විත් (Bandwidth) එකෙන්. ඒවායේ ශක්තිය මනින්නේ සංඛ්‍යාතයෙන් හෙවත් ෆ්‍රීක්වන්සි (frequency) වලිනි. දැන් තියෙන විදුලි සංදේශ තාක්ෂණය භාවිතා කරමින් උත්පාදනය කරන්නේ 10GHz තරම් සංඛ්‍යාතයක් ඇති දත්ත ගෙනයන ආලෝක ස්පන්දන හෙවත් පල්ස් (pulse) ය.

එම පර්යේෂකයින් පවසන්නේ දත්ත රැගෙන යන ආලෝක තරංගවල බෑන්ඩ්විත් එක හැකිලීමෙන් එහි සංඛ්‍යාතය වැඩි වෙන බවයි. ඒකෙන් තේරෙන්නේ පල්ස්වල ශක්තිය වැඩි වෙනවා කියන එකයි. ඒ නිසා කලින්ට වඩා දත්ත රැගෙන යන වේගය වැඩි වෙන බවයි. ඒ සඳහා ඔවුන් අලුත් උපාංගයක් යොදා ගත්තා. ඒකට සිලිකන් වේව්ගයිඩ්ස් (silicon waveguides) කියලයි කියන්නෙ. පසුව ඒ උපාංගය ෆයිබර් ඔප්ටික් කේබල් තුළට සවිකරනවා. එතැන් පටන් දත්ත ගමන් කරන්නේ අලුත් ශක්තියක් ඇතිව නිසා වේගය ගොඩක් වැඩියි.

මේ සිලිකන් වේව්ගයිඩ්ස් ගණනාවක් එකතු කර තවත් උපකරණයක් හදලා තියෙනවා. ඒකට කියන්නේ ටයිම් ටෙලෙස්කෝප් (Time Telescope) කියලා. ඒකට සිංහලෙන් කියන්නේ කාල දුරේක්ෂය කියලයි. මෙම උපකරණයෙන් කරන්නේ ආලෝකය හකුළුවාලීමයි. කාලය හා ආලෝකය අතර සංසිද්ධීන් භෞතික විද්‍යාව පිළිබඳ අවබෝධයක් ඇති අය දන්නවා. ඒ කියන්නේ කෘතිම ලෙස ආලෝක තරංග හකුළුවාලීම යනු කාලය හකුළුවාලීමයි. ඒ නිසා තමයි, එම උපකරණයට කාල දුරේක්ෂය කියන්නේ.

අන්තර්ජාලයේ දී දත්ත හුවමාරු කරන්නේ ඩේටා පැකට් ලෙසයි. එම ඩේටා පැකට්ටුවකින් රැගෙන යා හැකි දත්ත ප්‍රමාණය ද කාල දුරේක්ෂය හරහා වැඩි කර දෙනවා. දැන් ඩේටා පැකට්ටුවකින් දත්ත හුවමාරු වන්නේ බිට් 24ක ප්‍රමාණයක්. නමුත් ආලෝකය හකුළුවාලීමෙන් ඩේටා ප්‍රමාණයද හැකිලීම නිසා ඩේටා ග්‍රෑම් එකක ප්‍රමාණය ද කුඩා වෙනවා. එම නිසාම අන්තර්ජාලයේදී තොරතුරු හුවමාරු වන වේගය විශාල ලෙස ඉහළ යනවා.

නමුත් ලංකාව වැනි අපේ රටවලට අලුත් තාක්ෂණය එන්න කාලයක් යනවා. දැන් භාවිතා වන ෆයිබර් ඔප්ටික් තාක්ෂණයත් ඉතාම මෑතකදී තමයි අපට එන්නේ. ඒ වගේම තාමත් එය කොළඹ වැනි ප්‍රධාන නගරවල විතරයි තියෙන්නේ. ඒ කියන්නේ ඈත ප්‍රදේශවල තාම තියෙන්නේ තඹ කේබල් භාවිතාවයි. ඒ නිසා අද අපි කතා කළ තාක්ෂණය අපේ රටට එනකොට ලෝකය කොතරම් ඉස්සරහට ගිහින් තියේවිද?...



## Sports



# උන්ට ඇති අපට නැති අපේ ක්‍රීඩාංගණ

2020 දී පැවැත්වීමට නියමිත දකුණු ආසියානු (සාග්) ක්‍රීඩා උළෙල සඳහා සත්කාරකත්වය ලබාදීමට ශ්‍රී ලංකාව සූදානම්ව ඇති බවට කතා පැතිර යමින් තිබුණි. මෙය සනාථ වූයේ මෙවර අයවැයෙන් දියගම ක්‍රීඩා සංකීර්ණය සංවර්ධනය කිරීමට රුපියල් මිලියන 1500ක් ද සුගතදාස ක්‍රීඩාංගණය වෙනුවෙන් රුපියල් මිලියන 1300ක් ද වෙන්කිරීමෙනි.

මේ ක්‍රීඩාංගණවලට මුදල් වෙන්කිරීම, ඒවා සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම අපේ රටේ මලල ක්‍රීඩාවට සුභදායකය. නමුත් මෙම ක්‍රීඩාංගණ නවීකරණය වන්නේ අපේ රටේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් නොව, 2020 දී පවත්වන්නට නියමිත සාග් ක්‍රීඩා උළෙල වෙනුවෙන්ය.

මේ අතර 2018 අප්‍රේල් මාසයේ ඕස්ට්‍රේලියාවේදී පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට සූදානම් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගැනීම වෙනුවෙන් පුහුණු තරඟාවලියක්වත් පැවැත්වීමට සුදුසු ක්‍රීඩාංණයක් නොමැති වීම කණගාටුවට කරුණකි.

පසුගිය 2016 දී උත්සවශ්‍රීයෙන් ආරම්භ කළ සුගතදාස ධාවන පථයේ නවීකරණ කටයුතු පසුගිය වසර අවසන් වීමට පෙර නිමකිරීමට සැලසුම් කෙරුනේ අපේ රටේ මලල ක්‍රීඩාව වෙනුවෙනි. නමුත් එය සැලසුම් කළ අයුරින් නිමකිරීමට අපේ රටේ ක්‍රීඩා බලධාරීන් අපොහොසත් විය.

එසේම 2012 වසරේ දී ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා උළෙල වෙනුවෙන් ප්‍රමිතියෙන් තොරව, තකහනියට ඉදිකළ ධාවන පථ අවුරුද්දක් පිරීමටත් ප්‍රථම අබලන් වූවා අපට මතකය. කෙසේවුවද මෙවැනි සැලසුමක් හා දැක්මක් නොමැති ක්‍රීඩා බලධාරීන්ගේ තකතීරු තීරණ නිසා දැන් අසරණව ඇත්තේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල වෙනුවෙන් බලාපොරොත්තු දල්වාගෙන සිටි අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ය. ඔවුන්ව මේ තත්වයට ඇද දැමීමෙන් අප රටට අහිමි වන ජයග්‍රහණ හා අත්දැකීම් 2020 දී සත්කාරකත්වය දක්වමින් පැවැත්වෙන සාග් ක්‍රීඩා උළෙලින් පිරිමසා ගැනීමට නොහැකි වනවා නිසැකය.

# පරාජය වූයේ නිලූකා ද? බලධාරීන් ද?




2017 ආසියානු මැරතන් තරඟය පසුගිය දා චීනයේ ඩොන්ගුවාන්හි දී නිමා වූයේ රටවල් රැසක ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වය හා සුවිශේෂී ජයග්‍රහණයන් මධ්‍යයේය. මැරතන් පිරිමි ඉසව්වෙන් කිරුළ දිනාගැනීමට ඉන්දියාව සමත් වූ අතර ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ ප්‍රදීප් අරුණසිරි එහි දසවන ස්ථානය හිමිකර ගත්තේ ඔහුගේ 'පුද්ගලික හොඳම දක්ෂතාවය' දක්වමින් වීමද සුවිශේෂීත්වයකි. තරඟය නිමකිරීමට ඔහුට ගත වූ කාලය පැය 2:20:58 කි. මෙලෙස පිරිමි මැරතන් ඉසව්ව තුළින් ශ්‍රී ලංකාව ඉහළට එසවෙද්දී, කාන්තා ඉසව්ව තුළින් අපේක්ෂිත ජයග්‍රහණ ගෙන ඒමට ශ්‍රී ලාංකීය ක්‍රීඩිකා නිලූකා ගීතානිට නොහැකි විය. පසුගිය වකවානුවේදී ක්‍රීඩාලෝලීන් අතර ඈ වැඩි කතාබහකට ලක්වූයේ කිසිඳු රැකුලක් නොලබමින් ගෙවන ඇගේ ක්‍රීඩා දිවිය පිළිබඳව හැඬූ කඳුළින් ඈ කියූ කතාව නිසාවෙනි. 2015 වසරේ ආසියානු මැරතන් තරඟාවලියේ 05 වන ස්ථානය හිමිකරගත් නිලූකා, 2016 වසරේදී රියෝ ඔලිම්පික් උළෙල සඳහාද සුදුසුකම් ලැබූ අතිදක්ෂ ක්‍රීඩිකාවකි. එහෙයින්ම ඇගේ මේ පරාජය යනු අපේ රටේ ක්‍රීඩාව පිළිබඳ නැවත සිතාබැලීමට හේතුවක් නොවන බව කාටනම් පැවසිය හැකිද?

# ආසියාවේ කළු සිංහයා....



'Mr and Ms Atlas and Fitness Expo 2017' කායවර්ධන තරඟාවලිය පසුගියදා ඇමෙරිකාවේ ටෙක්සාස්හි දී නිමාවට පත්විය. ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු රටවල් 8ක ක්‍රීඩකයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු මෙම තරඟාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ ලූෂන් පුෂ්පරාජ් මෙම තරඟාවලියේ සිව්වන ස්ථානය දිනාගැනීමට සමත් විය.

'ආසියාවේ කළු සිංහයා' නමින් ප්‍රචලිත ඔහු මීට පෙර දකුණු කොරියාවේ පැවති 'Asian Bodybuilding and Physiques Sports Championship' තරඟාවලියේදී රන් පදක්කම් දිනාගැනීමට සමත් විය. කායවර්ධන ක්‍රීඩාව හරහා තම උපරිමය කැපකොට ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය තුළ ඔසවා තැබීම ඔහුගේ අරමුණයි. ඒ සඳහා ඔහුට FORWORD අපේ සුබ පැතුම්!

# කවි නිර්මාණය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**

ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන්කරන්න.
මෙන්න අපගේ ලිපිනය
*FORWARD කවි පිටුව,*
*අංක 464/20, පන්නිපිටිය පාර,*
*පැලවත්ත, බත්තරමුල්ල.*

## මල් පාත්තිය

ගඳපාන ගස්
කුප්පමේනිය
තරගෙකට ඇත
එළඹිලා

කපටි තණපත්
බිම විකාගෙන
ඇදෙයි හැම
අහුමුළු කරා

කිසිම සුවඳක්
දෙන්න අසමත්
කෝලියස්ටත්
බයවෙලා

මල වඩාගත්
රෝස පැළයක්
සිය කැමැත්තෙන්
මිටිවෙලා

] FB **ඇසුරෙන්** [



## පරනොවන රතුමල

අඳුර ගනඳුර යට
දහම සැඟවූ විට
උගුල්ලන බව දැන
දැස් ඇරියා නුඹ...
පොළොව කර්කශ කල
දිය පොදක් නැති තැන
වගුර ලේ දහඩිය
සරු කළා නුඹ බිම...
කොඳු හකුළ දණ වැද
මරණයට බියවැද
ඉඳ නොසිට තලු මර
වැපිරුවා බිජු එලබර...
ඉරන බව දැන දැන
ඉරුණු හදවත්වල
බිඳුණු තැන් සුවකර
පුබුදුවා හද මල...
ඊයේ අද මෙන් හෙට
නුඹ සුවඳ කළ මග
දහස් මල් ඇහැරී ප්‍රභාතය
ලොවට ළංවෙනු ඇත...!

] **මියැසි දිමෝෂා**[

## වානරයෝ

විරිත්තති
නියවති
පස්ස පෙන්නති
දළු කඩ කඩා
හප හපා කෙළ ගසති
කොළ, අතු කඩා විසි කරති
ඇට රිලව්
හැලි වඳුරෝ...
සල්ලි ගස් උඩ
නැග ගත්...

] FB **ඇසුරෙන්** [

## තරුණකම

නොතැලෙන යකඩ මලකා
මොටවෙන තාලේ....
මිල කළ නොහැක නයිදෙට
වැඩ නැත රාලේ....
ගිනියම් වෙලා කිණිහිර මත
පහර කන
තැලෙනා යකඩ මුවහත් වන
බව හැඳින
නිදිගැට හලා සිය වෙර වීරිය රැගෙන
එනු සොහොයුර පෙරට එය වේ
තරුණකම...

] **ගාමිණී දිසානායක**[

## උන් සහ අපි

උන්...,
බෙදා ටකරමක්
උදලු තලයක්, බේසමක්
සිල් ගන්න
රෙද්දකුත්
වැටෙයි දෙපතුලේ
කතිරයක් වෙනුවෙන්
අට පාස් නැති එවුන්
රට ක(ර)යි ආයෙත්...
අපි ...,
සුදුසුකම් ගොඩගහන්
පෝලිමේ ඇණ තියන්
වැටෙයි උන්ගේ
දෙපතුලේ
මාස් පඩියක් වෙනුවෙන්...

] **හිරුමාලි දිසානායක** [



# දැන් කළ යුත්තේ කලාවට ආදරය කරන පිරිසකට රටේ බලය ලබාදීමයි



## ජෙහාන් අප්පුහාමි

**ඔබව හඳුන්වා දෙන්න කැමති කොහොමද?**

මම සරල මනුෂ්‍යයෙක්. ඒක තමයි මට මගේ ගැන කියන්න තියෙන නිර්වචනය.

**ඔබ කලාවට යොමු වුණේ කොහොමද?**

මගේ ගම හලාවත. මම පාසල් ගියේ ශාන්ත මරියා විද්‍යාලයට. පාසල් කාලයේදී මම පැසිපන්දු සහ පා පන්දු ක්‍රීඩයෙක්. ශාන් කියලා මම දන්න අයියා කෙනෙක් හිටියා. ඔවුන් නාට්‍ය කණ්ඩායම් හදාගෙන නාට්‍යය වැඩකටයුතු කරනවා. මම ඔවුන්ට උදව් කරන්න යනවා. එක දවසක් රඟපාන කෙනෙක්ගෙ අඩුවක් තිබුණා. ඒ අඩුව පුරවන්න එදා මම රඟපානවා. ඊට පසුව ගාමිණී ජයකොඩි සර්ගෙන් රංග කලාව ඉගෙන ගන්නවා. පසුව කොළඹට ඒමත් සමඟ නාට්‍යය බලනවා, නාට්‍යය හා රංග කලාව හදාරනවා. මගේ කලා ජීවිතයට ප්‍රවිෂ්ටය එතැනින් ලබා ගන්නවා.

**අපේ රටේ කලාව පිළිබඳව ඔබට දැනෙන්නේ කොහොමද?**

මේ රට ගතහොත් මුළු සිස්ටම් එකම අවුල්. එවැනි තැනක කලාව පමණක් සුජාතභාවයෙන් පවතින්නේ නෑ. මේක විසඳන්න පැහැදිලි දේශපාලන යාන්ත්‍රණයක් අවශ්‍යයි. දැන් ගතහොත් අපේ රටේ කලාව භාර අමාත්‍යංශයක් තිබෙනවා. ඒකෙ කාර්යය තමයි අයවැයෙන් අමාත්‍යංශයට වෙන් කරන මුදල වියදම් කරන එක. ඕන නම් වර්ෂයකට සැරයක් නාට්‍යය උළෙලක් කරාවි. ඒකෙදි සම්මාන කිහිපයක් දෙයි. මේ අමාත්‍යංශයෙන් වෙන මොනවද මෙතෙක් කලකට කලාව වෙනුවෙන් කරලා තියෙන්නේ? අපි හිතුවා මේක 2015 ජනවාරි 08 න් පස්සෙවත් වෙනස් වෙයි කියලා. ඒ නිසා දැන් කලාවට ආදරය කරන, කලාව ගැන හැඟීමක් තිබෙන, දේශපාලනයක නියැලෙන පාලකයින් පිරිසක් රට භාර ගතයුතුයි. නැත්නම් කලාව වෙනුවෙන් මොන විසඳුම් තිබුණත් කලාවේ තිබෙන අර්බුදය විසඳිය නොහැකියි.

**කලාකරුවෙකුට ඔහුගේ කලා ජීවිතයේ ඉදිරි ගමන සඳහා සම්මාන කොයිතරම් දුරට ඉවහල් වෙනවද?**

සම්මාන කියන්නේ කලාකරුවෙකුට ඔහුගේ කලා ජීවිතයට ලැබෙන ඉතා වටිනා ඇගයීමක්. හැබැයි කලාකරුවෙක් ඇගයීම්, සම්මාන බලාපොරොත්තුවෙන් කලා නිර්මාණ නොකළ යුතුයි.

**කලා ජීවිතයේ ඔබ ලබාගත් ජයග්‍රහණ ගැන කතා කළහොත්?**

කලා ජීවිතයේ මම ලබාගත් ජයග්‍රහණ ගැන කතා කළහොත් මට ලැබුණු සම්මාන මගේ ගෙදර තියාගන්න ඉඩ නැතිව ගෝනි දෙකක් පුරවලා යාළුවෙක්ගේ ගෙදර තමයි තියෙන්නේ. මම කරපු නිර්මාණවලින් "සිංදු පහයි කෝල් පහක්" නාට්‍යය සඳහා යෞවන නටයය උළලේදී සම්මාන 07 ක්, රාජ්‍ය නාට්‍ය උළලේ සම්මාන 08ක් ලැබෙනවා. "හොරු" කියන නාට්‍යය සඳහා රාජ්‍යය නාට්‍යය උළලේ සම්මාන 04ක් ලැබෙනවා. "හාඩ් ජර්නි" නාට්‍යය සඳහා සම්මාන උළලේදී සම්මාන 06ක් ලැබෙනවා. මගේ වාර්ථා වැඩසටහනක් වන "හයිඩ් ඇන්ඩ් ලයික්" කියන වාර්ථා වැඩසටහන සඳහා රාජ්‍ය ටෙලි සම්මාන උළලේදී හොඳම වැඩසටහනට හිමි සම්මානය ලැබෙනවා. ඊට අමතරව සාර්ක් සම්මාන උළලේදි හොඳම නළුවාට හිමි සම්මානයත් (සය පෙති කුසුම) මෙවර යෞවන නාට්‍යය උළලේදී හොඳම නළුවාට හිමි සම්මානයක් ලැබෙනවා.

**සමාජ මතයක් ගොඩනැගීම සඳහා කලාව කොයිතරම් දුරට ප්‍රයෝජනවත්ද?**

ඔව් ඒක තමයි මම මේ කරමින් ඉන්නේ. මම නාට්‍යය කරන්නේ මම විශ්වාස කරන සමාජ මතය ගොඩනැගීම සඳහායි. කලාවට සමාජ මතයක් ගොඩනගන්න පුළුවන් කියන එකේ බලපෑමෙන් තමයි පසුගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂට ගෙදර යන්න සිදුවෙන්නේ.

**කලාකරුවා ඇතුළු අපේ රටේ තරුණයා මුහුණ දෙන අභියෝග ගැන ඔබගේ අදහස කුමක්ද?**

ඇත්තටම ගත්තොත් මේ රට කියන්නේම අභියෝගයක්. මේකෙ ජීවත් වෙනවා කියන අභියෝගයේ දී තමන් කැමති කෑමක්, කලාවක්, දේශපාලනයක් යන සියලු දේම අභියෝග.

**ඔබට මේ රටේ තාරුණ්‍යයට ලබා දෙන්න තිබෙන පණිවිඩය කුමක්ද?**

ගොඩක් වෙලාවට මගේ නිර්මාණ තුළ මම ලබාදෙන්න තිබෙන පණිවිඩය තරුණයාට පමණක් නොව සමාජයටම ලබා දෙනවා. මම කියන්නේ ඔබට මනුෂ්‍යයන් ලෙස මෙම සමාජයට කළ හැකි සේවය ඔබ තවම ඉටුකර නැහැ. එය ඉටුකිරීමට පමාවීමේ පාඩුව සමාජයට සහ ඔබට දැනෙන දිනය වැඩි ඈතක නොවෙයි.

*39 වන යොවුන් නාට්‍යය උළෙල පසුගියදා නිමාවට පත්විය. එහි හොඳම නළුවා හා හොඳම නිළියන් ලෙස සම්මාන හිමි කරගන්නේ ජෙහාන්, ඉෂඩී හා මිහිරියි. මේ FORWARD ඔවුන් සමඟ කළ කතා බහයි.*

# අද වාණිජ කලාවට තමයි තැනක් තියෙන්නේ



## මිහිරි ප්‍රියංගනී

**ඔබව හඳුන්වා දෙන්න කැමති කොහොමද?**

මම මිහිරි ප්‍රියංගනී යාපා. ගුරුවරියක් ලෙස කටයුතු කරනවාට අමතරව රංගන ශිල්පිණියක් ලෙසත් කටයුතු කරනවා.

**ඔබ කලාවට යොමු වුණේ කොහොමද?**

පාසල් යන කාලයේ නම් නාට්‍යවලට සම්බන්ධ වුණේ නැහැ. මම සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ඇතුළත් වුනාට පස්සෙයි නාට්‍යවලට සම්බන්ධ වෙන්නෙ. එහිදී ප්‍රසන්නජිත් අබේසූරිය කථිකාචාර්යවරයා යටතේ නාට්‍ය හා රංග කලා විෂය අවුරුදු හතරක් හදාරන්න හැකි වුණා. ඒ අතරෙදි විවිධ නාට්‍යකරුවන් සමඟ වැඩකරන්න අවස්ථාව ලැබුණා. එහිදී ඊ.එම්.ඩී. උපාලි මහතාගේ "වන තාරාවී" නාට්‍යයේ 'හෙඩ්විග්' චරිතයෙන් මගේ නාට්‍ය ජීවිතය ආරම්භ වෙනවා.

**අපේ රටේ කලාව පිළිබඳව ඔබට දැනෙන්නේ කෙහොමද?**

නාට්‍ය කලාව ගත්තොත් අද වාණිජ කලාවට තමයි තැනක් තියෙන්නේ. සම්භාව්‍ය නිර්මාණවලට සමාජය තුළ ඇති ඉඩ බොහොම අඩුයි. චිත්‍රපට ගත්තත් වේදිකා නාට්‍ය ගත්තත් වාණිජමය කලාවට වැඩි ඉඩකඩක්, අවස්ථාවක් ලැබෙනවා.

**05. කලාකරුවෙකුට තමන්ගේ කලා ජීවිතයේ ඉදිරි ගමන සඳහා සම්මාන හා ජයග්‍රහණවලින් වන බලපෑම මොන වගේද?**

පසුගියදා පැවති යෞවන සම්මාන උළලේදී හොඳම නිළියට හිමි සම්මාන දෙකක් ප්‍රධානය කළා. ඒ සම්මානය ලැබුණු එක්කෙනක් තමයි මම. ඒ ඇමරිකානු නාට්‍යකරුවෙක් වන ආතර් මිලර් ගේ 'The Crucible' නාට්‍යයේ ගාමිණී වියන්ගොඩ මහතා විසින් පරිවර්තනය කර, උෂාන් පෙරේරා විසින් අධ්‍යක්ෂණය කළ 'මායා බන්ධන' නාට්‍යයේ එලිසබෙත් ප්‍රොක්ටර්ගේ චරිතයට. යෞවන සම්මාන උළෙලකදී මට ලැබුණු ප්‍රථම සම්මානය මෙයයි.

ඊට අමතරව රාජ්‍ය නාට්‍ය හා විශ්වවිද්‍යාලයෙ නාට්‍ය උළෙලවලදීත් සම්මාන ලැබී තිබෙනවා. හැබැයි සම්මාන ලැබුණා කියලා 07 පිටුවට >>

# සිහින සැබෑ කරගැනීම සඳහා අරගල කරන්න



## ඉෂඩී ගුණසේකර

**ඔබව හඳුන්වා දෙන්න කැමති කොහොමද?**

මම කැමතියි වේදිකා නාට්‍ය ක්ෂේත්‍රය හදාරන කෙනෙක් විදිහට මාව හඳුන්වා දෙන්න.

**ඔබ කලාවට යොමු වුණේ කොහොමද?**

මම මුලින්ම හැදෑරුවේ නර්තනය. ඊට පසුවයි පාසල් සමයේදී වේදිකා නාට්‍යවලට යොමුවන්නේ. අනතුරුව ධර්මසිරි බණ්ඩාරනායකයන්ගේ නාට්‍යවල නැවත නිෂ්පාදන සමඟ සම්බන්ධ වුණා.

**සම්මානයක් ලැබීම කලාකරුවකුගේ ජීවිතයට කොතරම් වැදගත් වෙනවද?**

සම්මානයක් කියන්නේ කුමන හෝ ආකාරයකට කලාකරුවෙක්ට ලැබෙන ඇගයීමක්. ඒක ඉතා වටිනාකමක් සහිතයි. එය විධිමත් ආකාරයට කෙරෙන්නේ නම් කලාකරුවාගේ ඉදිරි ගමන හැඩගස්වා ගැනීමට එය හොඳ අවස්ථාවක්.

**කලා ජීවිතයේ ඔබ ලබාගත් ජයග්‍රහණ පිළිබඳවත් සඳහන් කළොත්?**

මගේ කලා ජීවිතයේ මම ලබපු පළමු ජයග්‍රහණය තමයි ධර්මසිරි බණ්ඩාරනායක කියන ඉතා කෘතහස්ත ප්‍රවීණ කලාකරුවා යටතේ වේදිකා නාට්‍යවලට යොමුවෙන්න ලැබීම. ඔහුත් සමඟ සම්බන්ධ වූ නාට්‍ය හතරෙන් තුනක්ම බාර මහ රන් නාට්‍ය උත්සවය සඳහා ඉදිරිපත් කෙරුණා. ඊට අමතරව මෑතක දී යෞවන නාට්‍ය උළලේ දී සුකරස කියන නාට්‍ය සඳහා හොඳම නිළියට හිමි සම්මානය හිමි වුණා. ඒ වගේම එම නාට්‍යය තියටර් ඔෆ් ඔලිම්පික් කියන නාට්‍ය උළලේ දර්ශන වාර දෙකක් සඳහාද තේරී තිබෙනවා. මෙය රටවල් 200කට අධික ප්‍රමාණයකින් නාට්‍ය 500ක් අතුරින් තේරුණු එකම සිංහල නාට්‍යයයි.

**කිසියම් සමාජ මතයක් ගොඩනැගීම සඳහා කලාකරුවාට කලාව කොතරම් දුරට උපකාරී වෙනවාද?**

මුළුමහත් සමාජයම ඔවුන් දිහා බලන් ඉන්නවා. විශේෂයෙන්ම ජනප්‍රිය අයෙක් නම් එසේ බලන පිරිස ඉතා ඉහළයි. ඔවුන්ගේ මුවෙන් පිටවෙන සෑම වාක්‍යයක් පාසාම සමාජ මතයක් ගොඩනැගිය හැකියි. කලා නිර්මාණවලින් සමාජ මතයක් ගොඩනැගීම කෙරෙහි උපරිම උත්සාහයක් දැරූ කලාකරුවන් ලෙස හෙන්රි ජයසේන, සුගතපාල ද සිල්වා, ධර්මසිරි 07 පිටුවට >>

# ග්‍රීක කොමියුනිස්ට් තරුණ සංගමය

## KNE Communist youth of Greece




ග්‍රීසියේ විශාලතම වාමාංශික තරුණ සංවිධානය වන්නේ ග්‍රීක කොමියුනිස්ට් පක්ෂයේ තරුණ අංශයයි. [Communist youth of Greece/ KNE]

1968 සැප්තැම්බර් මස 15 දින ග්‍රීක කොමියුනිස්ට් පක්ෂයේ [KKE] මධ්‍යම කාරක සභාවේ තීරණයක් මත එහි තරුණ අංශය [KNE] පිහිටුවන ලදී. මාක්ස් ලෙනින්වාදී දර්ශනය මත ක්‍රියාත්මක වන මෙම සංවිධානය ජාතික තලයේත්, ජාත්‍යන්තර තලයේත් ඉතාම සක්‍රීය අයුරින් කටයුතු කරයි.

"පීඩිත පංතියේ ජීවන තත්වය, අධ්‍යාපනය හා රැකියාව යම් මට්ටමකින් උසස් කිරීමට පමණක් අප සටන් නොකරන්නෙමු! එසේ වුවත් ජනතාවට සුළු හෝ සහනයක් ලැබෙන කුඩා අරගලයක් හෝ අත්නොහරින්නෙමු! නමුත් සැබෑ වෙනසක් ඇති කළ හැක්කේ ධනේශ්වර ක්‍රමය අවසන් කර සමාජවාදය බිහිකිරීමෙන් පමණක් බව අපි අවධාරණය කරන්නෙමු."

ඔවුන් ජාතික තලයේදී තරුණයින්ගේ ප්‍රශ්න වෙනුවෙන් මතවාදීවත්, වීදියේත් එක ලෙස සටන් කරයි. එසේම ගොවි, කම්කරු හා ශිෂ්‍ය ආදී සෑම අරගලයකටමද එක ලෙස දායක වෙයි.

එමෙන්ම ග්‍රීසියේ පවත්වනු ලබන විශාලතම දේශපාලනික හා සංස්කෘතික උළෙල පැවැත්වීමට ද ඔවුන් කටයුතු කරයි. 2017 වර්ෂයේ ජුනි මාසයේ දී 43 වරට පැවති මෙම උළෙල හි තේමාව වූයේ සෝවියට් විප්ලවයේ 100 වැනි සංවත්සරයයි.

මීටත් අමතරව ජාත්‍යන්තර තලයේදීත් KNE ඉතා සක්‍රීය දේශපාලන මැදිහත් වීමක් සිදු කරයි. එය ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ [WFDY] ක්‍රියාකාරී සාමාජිකයෙකි. පසුගිය දා අවසන් වූ ලෝක තරුණ හා ශිෂ්‍ය උළලේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කිරීමටද KNE සමත් වූ අතර විශේෂයෙන්ම ජාත්‍යන්තර සංක්‍රමණික ගැටලුව විසඳීමට හා පලස්තීනයට සහයෝගය පළ කිරීමටද කොන්දේසි විරහිතව පෙනී සිටියේය.

ඔවුන් ලංකාවේ සමාජවාදී තරුණ සංගමය සමඟත් කලාපයේ කොමියුනිස්ට් තරුණ සංගම් සමඟත් ශක්තිමත් සබඳතාවයක් පවත්වමින් ධනේශ්වර ක්‍රමයට එරෙහිව සමාජවාදය වෙනුවෙන් අනවරත අරගලයක යෙදී සිටී.

ඔවුන්ගේ නිල වෙබ් අඩවිය වන්නේ int.kne.gr ය.



# වෙනිසියුලාවෙන් ඩිජිටල් මුදල් ඒකකයක්



වෙනිසියුලාව පෙට්‍රෝ නමින් අන්තර්ජාල ඩිජිටල් මුදල් ඒකකයක් දියත් කිරීමට සූදානමින් සිටින බව එරට ජනාධිපති නිකලෝස් මදුරෝ විසින් පසුගිය දා සඳහන් කර ඇත. විශේෂයෙන්ම ඇමරිකාවෙන් තම රටට එල්ල වී ඇති සම්බාධකවලට පිළිතුරක් ලෙස මෙය සිදුකිරීමට සැලසුම් කර ඇතැයි ඔහු පැවසීය. එරට භාවිත මුදල් ඒකකය වන බොලිවාර් ආසන්න සති හතරක කාලය තුළ දී 57% කින් අවප්‍රමාණය වීමත් සමඟ එරට බලධාරීන් විසින් මේ පියවර ගෙන ඇත.

එසේම වෙනිසියුලාව සතුව දැවැන්ත තෙල් හා ගෑස් සම්පතක් මෙන්ම තවත් ස්වාභාවික සම්පත් රැසක්ම පැවතීම නිසා ඒ හරහා රටේ ආර්ථිකය නගාසිටුවමින් හා ආර්ථික ස්වාධීනත්වය ආරක්ෂා කරගනිමින්, මූල්‍යමය සම්බාධක තුරන් කිරීමේ අරමුණින් මෙවැනි පිළිවෙතකට අවතීර්ණ වීමට තීරණය කර ඇත.

# ආර්ජන්ටිනාවේ විශ්‍රාම වැටුප් විරෝධයක්



ආර්ජන්ටීනියානු රජය විසින් එරට සිදුකිරීමට නියමිත විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණයට එරෙහිව එහි ජනතාව සිය විරෝධය එල්ල කර ඇත. එම යෝජනාව කොංග්‍රස් මණ්ඩලයේ විවාදයට ගන්නා අවස්ථාවේදී බුවනෝස් අයර්ස්හි දී මෙම විරෝධතාව පවත්වා ඇත. එරට පහළ මන්ත්‍රී මණ්ඩලය මෙම පනතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමට නියමිතව තිබුණත් එය අත්හිටුවා ඇත. කෙසේවෙතත් ආර්ජන්ටීනියානු රජය පවසා සිටින්නේ මෙම ප්‍රතිසංස්කරණ හරහා රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය යම්තරමකින් හෝ පාලනය කරගත හැකි බවයි. තවද මෙම විරෝධතා මැදපෙරදිග සිට උතුරු අප්‍රිකාව හරහා ආසියානු කලාපය වෙතත් ව්‍යාප්ත වී ඇත. විරෝධතා හේතුවෙන් මේ වන විට පුද්ගලයින් 157 දෙනෙකු තුවාල ලබා ඇතැයි ද වැඩිදුරටත් වාර්තා වේ.

# රිදී ජුබිලිය සමරන SMS



පසුගිය දෙසැම්බර් 03 වෙනිදා ලෝකයේ ප්‍රථම කෙටි පණිවිඩය සිය 25 වෙනි සංවත්සරය සැමරීය. එහි සුභ නත්තලක් ලෙස (Merry Christmas) සඳහන් වී තිබුණි. 1992 දී ඉංජිනේරුවෙක් වූ නීල් පැප්වෝර්ත් අත්හදා බැලීමක් ලෙස පරිගණකය හරහා සිය මිත්‍රයෙකුට මෙම කෙටි පණිවිඩය යවා තිබුණි.

එදා සිට අද දක්වා ස්මාර්ට් ජංගම දුරකථනයන්හි භාවිතා කෙරන සියදහස් ගණනක් ඇප්ලිකේෂන් සඳහා ද මුල් වූයේ මෙම සේවාවයි. ස්මාර්ට් ජංගම දුරකථනවලට පළමු පියවර ලෙස මෙම sms හඳුන්වා ඇත. දත්තවලට අනුව එක් වසරකදී ලොව පුරා ජංගම දුරකථන භාවිතා කරන්නන් විසින් කෙටි පණිවිඩ ට්‍රිලියන 8.6 ක ප්‍රමාණයක් යවනු ලබයි.

# හොන්ඩියුරාස් ජනාධිපතිවරණ ප්‍රතිඵල දූෂිතයිලු!



හොන්ඩියුරාස් හි පසුගිය මස පැවති ජනාධිපතිවරණයේ ප්‍රතිඵල වෙනස්කර ඇති බවට එරට විපක්ෂ අපේක්ෂක සැල්වදෝර් නස්රල්ලා චෝදනා කරයි. මැතිවරණය පැවති දා එම ප්‍රතිඵල මැතිවරණ කාර්යාල වෙබ් අඩවියේ පළකරමින් පැවති බවත්, පසුදා අලුයම් වනවිටත් නස්රල්ලා ඉදිරියෙන් සිටීමට සමත්ව සිටි බවත් එරට මාධ්‍ය පවසයි. කෙසේවෙතත් පසුදා දහවල් වනවිට එරට මැතිවරණ බලධාරීන් විසින් එම මැතිවරණ තොරතුරු යාවත්කාලීන කිරීම අත්හිටුවා තිබුණි.

තවද, ඡන්ද ගණන් කිරීමේ කටයුතු එකවරම මන්දගාමී වූ බවත් එම මාධ්‍ය වාර්තා සඳහන් කර ඇත. මෙයට විරෝධය පාමින් එරට ටෙගුසිගල්පා අගනුවරට රැස්වූ දහස් ගණනක් විරෝධතාකරුවන් උද්ඝෝෂණවල නිරත වූහ.

# නේපාල කොමියුනිස්ට් පක්ෂය මහ මැතිවරණය ජය ගනී



නේපාල මහ මැතිවරණයේ ප්‍රතිඵල අනුව කොමියුනිස්ට් පක්ෂය ප්‍රමුඛ වාමාංශික සන්ධානය බහුතර බලය සහිතව ජයග්‍රහණය කිරීමට සමත් වී ඇත. මැතිවරණයේ ප්‍රකාශිත ප්‍රතිඵල අනුව සෘජුව තෝරා පත්කර ගන්නා මන්ත්‍රීවරුන් 165න් 116ක් ජයග්‍රහණය කිරීමට ඔවුන් සමත්ව සිටී. ඉන්දීය හිතවාදී පාලනයක් අනුගමනය කරමින් සිටි පාලක කොංග්‍රස් පක්ෂය මැතිවරණයෙන් දරුණු පරාජයක් අත්කර ගෙන ඇති අතර මීළඟ අග්‍රාමාත්‍යවරයා ලෙස කද්ගා ප්‍රසාද් ඕලි පත්වනු ඇති බවට අනුමාන කෙරේ.



# මුල්ම තාරකාව බිහිවීම හා සුපර්නෝවා පිපිරුම

විශ්වයේ ඇති වූ හයිඩ්‍රජන් මුලින්ම මීදුමක් වගේ වෙලා ඊට පස්සෙ කැලති කැලතී දරණ ගැහෙන්නට පටන් ගත්තා. එසේ දරණ ගැහුණු හයිඩ්‍රජන් ගුරුත්වාකර්ෂණ බලය නිසා ගෝල බවට පත්වෙන්න පටන් ගත්තා. ලොකු වෙන්න ලොකු වෙන්න මේ ගෝලවල ගුරුත්වාකර්ෂණ බලය තව තවත් වැඩි වුණා. ගුරුත්වාකර්ෂණය වැඩි වෙන පමණට තව තවත් හයිඩ්‍රජන් ඒ ගෝල කරා ආකර්ෂණය වුණා. එතකොට ඒ ගෝල තව තවත් ලොකු වුණා. එහෙම ලොකු වෙන්න ලොකු වෙන්න ගෝලවල සම්පීඩනයත් ඒ අනුව රත්වීමත් තව තව වැඩි වුණා. රත්වීම අතිශයින් ඉහළ මට්ටමට පැමිණි විට ඒ දැවැන්ත හයිඩ්‍රජන් ගෝල ගිනිගෙන මව් තාරකා බවට පත්වුණා. එම නිසා තාරකා මධ්‍යයේ හයිඩ්‍රජන් දහනය වී හීලියම් නිපදවීම සිදුවුණා. එවිට තාරකා ක්‍රියාත්මක වන්නේ සෙමින් ක්‍රියාකරනා හයිඩ්‍රජන් බෝම්බයක් වගෙයි. මෙහිදී අතිශය සද්ධන්ත ශක්ති ප්‍රමාණයක් සමඟ තාපය සහ ආලෝකය විකිරණ ලෙස පිටවෙනවා. මේසා විශාල තාප ප්‍රමාණයක් පිටවීමේදී තාරකාව ප්‍රසාරණය විය යුතු නමුත් ගුරුත්වාකර්ෂණය නිසා තාරකාව ප්‍රසාරණය නොවී ඇද තබා ගන්නවා.

තාපය නිසා ඇති වන ප්‍රසාරණයේ ප්‍රමාණයත්, ගුරුත්වාකර්ෂණයෙන් අභ්‍යන්තරය දෙසට සංකෝචනය කරනා ප්‍රමාණයත් සමතුලිත වන නිසා සාපේක්ෂ ප්‍රසාරණයක් වන්නේ නැහැ. තාරකාවේ උණුසුම වැඩි වන තරමට ප්‍රසාරණය වීමද වැඩි වනවා. එසේ ප්‍රසාරණය වැඩි වන විට තාරකාවේ මැද ස්කන්ධ ඝනත්වය අඩු වනවා. එම නිසා තාරකාව නැවත සංකෝචනය වනවා. එවිට නැවත උණුසුම වැඩි වනවා. එම නිසා තාරකාව ක්‍රියා කරන්නේ ස්වයං උෂ්ණත්ව පාලන උපකරණයක් ලෙසිනුයි. තාරකාවේ නිතරම මධ්‍යස්ථ ප්‍රමාණයකට උෂ්ණත්වය ස්ථාවරව එළැඹීමෙන් නිරන්තරව සමතුලිතව පවතිනවා. එම නිසා තාරකාවේ ප්‍රමාණය වන්නේ හැමවිටම තාපය නිසා එය ප්‍රසාරණය වීමට ඇති ප්‍රවණතාවයත්, ගුරුත්වාකර්ෂණය නිසා එය සංකෝචනය වීමේ ප්‍රවණතාවයත් සමතුලිත වූ අවස්ථාවයි. අවකාශය පුරා හැම තැනකම ඒ විදියට දැවැන්ත මව් තාරකා ඇති වුණා. අපට ආසන්නම තාරකාව වන්නේ "ප්‍රොක්සිමා සෙන්චුරි" නම් තාරකාව වන අතර අපගේ සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යයා ද එවැනිම තාරකාවකි.







සියලුම ආකාරයේ තාරකා කිසියම් දිනෙක මිය යා යුතුයි. එයින් ඇතැම් තාරකාවන් ඉතා සන්සුන්ව මිලින වී මිය යන අතර ඇතැම් තාරකා මිය යන්නේ 'සුපර්නෝවා' නමින් හැඳින්වෙන ඉතාමත් ප්‍රචණ්ඩ වූ අතිශයින් දැවන්ත පිපිරීමක් සමඟ යි. සුපර්නෝවා අවස්ථාවකට පත්වී මිය යාමට නම් තාරකාවක ස්කන්ධය අපේ සූර්යයාගේ ස්කන්ධය මෙන් අට ගුණයක්වත් විය යුතුය. සුපර්නෝවා පිපිරීමක් ඇති වන්නේ තාරකාව සතු හයිඩ්‍රජන් ඉන්ධන ප්‍රමාණය දැවී යාමේදී හීලියම් දහනය සිදුවීමෙනි. එම අවස්ථාවේදී එය "රතු දැවන්තයා" (Red Giant) ලෙස හඳුන්වනවා. මෙසේ ප්‍රසාරණය වන තාරකාවේ මදය වඩ වඩාත් ගිනියම් වීම නිසා හයිඩ්‍රජන් සහ හීලියම් සංඝටනය වීමෙන් වඩා සංකීර්ණ වූ ඔක්සිජන්, කාබන් සහ කැල්සියම් ද අනෙකුත් මූලද්‍රව්‍ය 86ක් ද බිහි වෙනවා. ඊළඟට සිදුවන්නේ තාරකාවේ මදය කඩාවැටී සුපර්නෝවා පිපිරීම සිදුවීමයි. එසේ තාරකාව පුපුරා යාමේදී තාරකාව තුළ බිහි වූ සියලු මූලද්‍රව්‍ය අවකාශයේ විසිරී ගොස් නව තාරකා බිහි කිරීමට දායකවනවා. එය හරියට මිය ගිය ශාක සත්ව ආදී ජීවීන් පසට ජීරණය වී යළි අලුත් ජීවීන් බිහි කිරීමට දායකවෙනවා වගෙයි.



# කියුබානු විප්ලවය

කියුබාව යනු ලතින් ඇමෙරිකානු රාජ්‍යයකි. එය උතුරු කැරිබියන් දූපත් අතර පිහිටි වර්ග කිලෝමීටර 99884ක් පමණ විශාල භූමියකින් සමන්විත රාජ්‍යයකි. බහුවාර්ගික හා බහු ආගමික සමාජයකින් සමන්විත රාජ්‍යයක් ලෙසද කියුබාව හඳුනාගත හැකිය. රටක් ලෙස කියුබාව මෙතරම් ජනප්‍රිය ඇයි? ලෝකයේ අස්සක් මුල්ලක් නෑර ලෝකවාසී ජනයාගේ මුව තුළ කියුබාව වරනැගෙන්නේ ඇයි? එයට හේතුවක් තිබේ. ඒ කියුබන් විප්ලවයෙන් පසුව බිහි වූ සමාජවාදී කියුබාව ලෝකවාසී ජනතාවගේ ජනාදරයට පාත්‍ර වූ නිසාය. සමාජවාදී කියුබානු ජනරජය තම රටේ පුරවැසියන්ටත් ලෝකවාසීන්ටත් ජයග්‍රහණ හා ආදර්ශ සපයා දුන් බලවත් රාජ්‍යයකි. ලෝක පොලිස්කාරයා වන ඇමෙරිකාවේ අතේ දුරින් පිහිටි කියුබාව, ඇමෙරිකාව ප්‍රමුඛ සමස්ථ ධනවාදී කඳවුරටම අභියෝග කරයි. එය යටත් නොවෙයි. එය බිය නොවෙයි. කොටින්ම පරාජයට පත් නොවෙයි. කියුබන් සමාජවාදී විප්ලවයේ අසහාය නායක ෆිදෙල් කස්ත්‍රෝ සහෝදරයාගේ අභාවයෙන් පසුව ද තවමත් සමාජවාදී රතු ධජය කියුබාවේ ළෙළ දෙයි.

සමාජවාදී කියුබන් විප්ලවය සිදුවීමට පෙර කියුබාව පාලනය කළේ ඒකාධිපති, ජනපති බැටිස්ටාය. එම පාලනය විසින් කියුබාවත් එහි ජනතාවත් ඉතා අසීරු අඩියකට ගෙන ආවේය. රට තුළ අභ්‍යන්තර කැරලි කෝලාහල ගණනාවක් පැන නැගි අතර ජනතාව සෑම අතින්ම පීඩාවට පත් විය. තදබල විරැකියාවක්ද කියුබාව තුළ පැවතුණි. යටිතල පහසුකම් ඉතා සීමිත විය. ජනයාගේ තත්වය එසේ වෙද්දී ඊට එරෙහිව ජනතාව වෙනුවෙන් හඬ නැගූ කොමියුනිස්ට්වාදීන් මතට මර්දනය ගෙන ඒමට බැටිස්ටා කටයුතු කළේය. මහජනතාවට යටිතල පහසුකම් නොදුන්න ද ආරක්ෂක අංශවල යටිතල පහසුකම් වර්ධනය කළේය. ඒ සඳහා ඇමෙරිකාවේ සහය ද ලබා ගත්තේය. එයම කියුබානු ආර්ථිකය තවතවත් දුර්වල කළේය. බැටිස්ටා විසින් කියුබානු ආර්ථිකය ඇමෙරිකානු සමාගම්වලට විවෘත කළේය. රටක ආර්ථිකය බාහිර රටකට හෝ බහුජාතික සමාගම්වලට විවෘත කිරීමේ නරක අත්දැකීම නිසා කියුබාවේ ආර්ථිකය කඩා වැටුණේය. වංචාව, දූෂණය පිරුණු රාජ්‍යයක් බවට කියුබාව පත් වුණි. 1952 දී බැටිස්ටා පාලනයේ පැවති වංචාවට හා දූෂණයට එරෙහිව තරුණ නීතිඥවරයෙකු වූ ෆිදෙල් කස්ත්‍රෝ සහෝදරයා විසින් පෙත්සමක් ඉදිරිපත් කළේය.


එවිට සිදුවීමට නියමිතව තිබූ දෙයම සිදුවිය. එනම් අධිකරණය, විධායකය යන රාජ්‍ය යාන්ත්‍රණය හරහා පෙත්සම ඉවත දැමීය. කොටින්ම ඒ ගැන වගවිභාගයක් පවා නොකළේය. ෆිදෙල් දැඩි තීන්දුවක් ගත්තේ එහිදීය. ඒකාධිපති බැටිස්ටාගේ පාලනයට එරෙහිව සන්නද්ධ අරගලයක් සිදුකිරීමට ෆිදෙල් තීරණය කළේය. 1953 ජූලි 26 දින මොන්කාඩෝ බැරැක්කයට එල්ල කළ ප්‍රහාරයක් සමඟ ඒ දුෂ්කර ගරිල්ලා අරගලය නව මාවතකට යොමු විය. අවසාන 1959 ජනවාරි 01 වැනිදා බැටිස්ටා පාලනය පරාජය කොට කියුබානු ජනරජය බිහිකරලීය. ෆිදෙල් කස්ත්‍රෝ සහ ඔහුගේ සොහොයුරු රාවුල් කස්ත්‍රෝ සමඟ චේ ද මේ සටනේ නියමු කාර්යයට දායක විය.

සැබවින්ම 1959 දී කියුබාවේ සිදු වූයේ කුමක්ද? ඒකාධිපති බැටිස්ටාගේ පාලනය පෙරළා දැමීමේ කෙසේද? එය සාධාරණද? එහි අරමුණ කුමක්ද? විවිධ ප්‍රතිගාමී කණ්ඩායම් විසින් මේවා අප ඉදිරියේ ප්‍රශ්න නගා ඇත. ඇත්තෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බැටිස්ටාගේ පාලනය පෙරළා දමා ජනතාවට යහපත උදා කිරීම සඳහා ගත් සියලු උත්සාහයන් අසාර්ථක වූ තැන එම ඒකාධිපති පාලනයට එරෙහිව සන්නද්ධ අරගලයට ප්‍රවිෂ්ට විය. එහෙත් සමාජවාදී විප්ලවය ධනේශ්වර යුද්ධ මෙන් නොව අභ්‍යන්තරයෙන්ම පාරිශුද්ධ ආක්‍රමණයකින් සිදුවන්නකි. ධනේශ්වර යුද්ධ ඇති වන්නේ ලාභය, බලය, ඒකාධිපතිත්වය, වහල්භාවය හා යටත්වැසියන් පවත්වා ගැනීමේ අරමුණෙනි. එහෙත් සමාජවාදී විප්ලවය යනු මානව ප්‍රේමය සහ සාධාරණත්වය පෙරටු කොට ගත්තකි. ධනේශ්වර යුද්ධයන්ගේ අරමුණ වන්නේ එක් පිරිසක් විසින් තවත් පිරිසක් මත යෙදෙන බලය මඟින් ඔවුන්ව පාලනය කිරීමයි. එහෙත් සමාජවාදී විප්ලවය යනු සියලු ආකාරයන්ගේ පීඩනයන් අහෝසි කොට මානවයාට නිදහස ලබා දීමේ අරමුණෙන් සිදුවන්නකි. කොටින්ම කියතොත් ධනේශ්වර යුද්ධවල අරමුණ වන්නේ එකෙකු දෙන්නෙකු රජ වී අනෙක් සියල්ලන් වහලුන් මෙන් පාලනය කිරීමයි. එහෙත් සමාජවාදී විප්ලවය යනු එකෙකුට දෙන්නෙකුට රජ වී සැප විඳීමට යොදාගත් අසාධාරණ එකක් නොවේ. දුගී දුප්පත්, පීඩිත ජනතාවගේ නිදහසත්, මානව ගෞරවයත්, සාධාරණත්වයත් ආරක්ෂා කරන්නකි. එනිසා කියුබානු විප්ලවය, ධනේශ්වර යුද්ධ හා කිසිසේත්ම සමාන කළ නොහැකිය. සන්නද්ධ අරගලයක් වූ පමණින් එය බැහැර නොකොට වෙනත් අර්ථකථනයකින් කියුබන් විප්ලවය කියවා ගත යුත්තේ එහෙයිනි.










Palestine
Day
අනුරාධපුරය
කෑගල්ල
කොළඹ

# යුක්තිය හා සාධාරණය ඉල්ලන මිනිසුන් වෙනුවෙන්...



පලස්තීනය වසර ගණනාවක් තිස්සේ තම දේශය ආරක්‍ෂා කර ගැනීමේ බරපතල ප්‍රශ්නයකට මුහුණ දෙමින් සිටියි. ඒ අත්තනෝමතික ලෙස පලස්තීන භූමිය ආක්‍රමණය කරමින් ඒ තුළ ඊශ්‍රායලය පිහිටවීමට එරෙහිවයි. අද එය හුදෙක් රාජ්‍යයන් දෙකක පවතින ගැටලුවකට එහා ගිය, ලෝක සාමයට තර්ජනයක් බව ප්‍රත්‍යක්‍ෂ කරන කරුණු බොහෝමයකි.

මේ තත්වය තවදුරටත් වර්ධනය කරමින් "ජෙරුසලම ඊශ්‍රායලයේ අගනුවර" ලෙස ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් පසුගිය දා ප්‍රකාශයට පත් කිරීමත් සමඟ පලස්තීනයට එරෙහිව පවතින ජාත්‍යන්තර හස්තයන් කෙතරම් ප්‍රබලදැයි හඳුනාගත හැකි විය. නමුත් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය තුළ රටවල් අති බහුතරයක් පලස්තීනයට සහයෝගය පළ කිරීමේ යෝජනාවට පක්‍ෂ වීම නිසා ලෝක බලවතෙකු වන ඇමරිකා එක්සත් ජනපදයට සිතූ ලෙස ලෝකය හැසිරවිය නොහැකි බවට වන පණිවිඩයත් ලෝක සාමය හා ඒකත්වය පිළිබඳ මුළු ලොවම අවදියෙන් සිටින බවත් ට්‍රම්ප් ඇතුළු අධිරාජ්‍යවාදී ලෝක බලවතුන්ට හඟවන ලදී.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය තුළ පලස්තීනයට සහයෝගය දැක්වූ රටවල් ගණන 128කි. ඇමරිකාව වෙනුවෙන් පෙනී සිටියේ කුඩා රාජ්‍යයන් 09ක් පමණි. එක් රටක් විසින් සිදුකරන අසාධාරණ බලපෑම්වලට එරෙහිව ලෝකයේ රටවල් බොහොමයක් එකට එක්වුණු අවස්ථාවක් ලෙස එය ඉතිහාසගත වනු ඇත. ඡන්දය පැවැත්වීමට ප්‍රථමව ඇමරිකානු ජනාධිපතිවරයා විසින් තර්ජනය කරමින් කියා සිටියේ තම රටින් විශාල ආධාර ප්‍රමාණයක් ලෝකයේ කුඩා රාජ්‍යයන් බොහොමයකට ලබාදෙන බවත් තම රාජ්‍යයට එරෙහි වන රාජ්‍යයන් පිළිබඳව ඉදිරියේදී දැඩිව ක්‍රියා කරන බවත්ය. එහෙත් මෙම තර්ජනයට පවා විරුද්ධව කටයුතු කළ රටවල් පිළිබඳව සතුටු විය හැකිය. එක් රටක ස්වෛරීත්වයට තර්ජනයක් එල්ල කරන අධිරාජ්‍යවාදය පැරදවීමට එලෙස එකතු වීම ඉතා ප්‍රගතිශීලී පියවරකි.

පලස්තීන සහයෝගීතාවය වෙනුවෙන් පෙළගැසුණු රාජ්‍යයන් අතර ශ්‍රී ලංකාවද සිටීම වැදගත්ය. මෙරට කිසිම ජාති, ආගම්, කුල, දේශපාලන පක්ෂ, පාට භේදයකින් තොරව පලස්තීනයට සිදුවන අසාධාරණයට එරෙහිව ශ්‍රී ලංකාව රටක් ලෙස පෙනීසිටීම යහපත්ය.

ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාව පුරා බැනර් හා පෙත්සම් අත්සන් කරමින් පලස්තීනයට සහය පළ කරන ලදී. රටේ සියලුම ආගමික නායකයින්, සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයින්, මාධ්‍යවේදීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විද්වතුන් හා ශ්‍රී ලංකාවේ විදේශීය තානාපතිවරුන් රැසකගේ සහභාගීත්වයෙන් පලස්තීන සහයෝගීතා සම්මන්ත්‍රණයක් පැවැත්විණි. සමාජවාදී තරුණ සංගමයද පසුගිය වසරවලදී මෙන්ම මෙවරද පලස්තීන ජනයා ගෙන යන සාධාරණ අරගලය පිළිබඳව රට පුරා ජනතාව දැනුවත් කරමින් හඬ නැගීය. එම හඬ මෙවර තවත් උපරිම ලෙස නැගීමට හැකි වීම යුක්තිය හා සාධාරණත්වය අගයන මිනිසුන් වෙත මහත් ධෛර්යයක් වූ බව නිසැකය.





## පලස්තීන සහයෝගයට වැඩසටහන් රැසක්



ජාත්‍යන්තර පලස්තීන සහයෝගීතා දිනයට සමගාමීව සමාජවාදී තරුණ සංගමය විසින් රට පුරා වැඩසටහන් රැසක් සංවිධානය කළේය. එහි ප්‍රධාන වැඩසටහන ලෙස "පලස්තීනයට ජීවත් වීමට ඉඩදෙනු!" මැයෙන් සම්මන්ත්‍රණයක් කොළඹ, මරදාන CSR හි දී නොවැම්බර් 29 වැනි දින පැවැත්විය. ඒ සඳහා ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපති සුහයිර් හම්දලාහ් සයිඩ් මහතා හා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ඇතුළු පිරිසක් සහභාගී වූහ. මීට අමතරව දිවයින පුරා අත්පත්‍රිකා බෙදාහැරීමේ හා පලස්තීන සහයෝගීතා බැනර් අත්සන් කිරීමේ වැඩසටහන් රැසක් ද සංවිධානය කර තිබුණි.

## රෝමයෙන් මතු වූ සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදරත්වය



සමාජවාදී තරුණ සංගමයෙහි රෝමයේ කමිටුව විසින් දෙසැම්බර් 10 වන දා "සහෝදරත්වයේ දිනය" වැඩසටහනක් පැවැත්වීය. ඒ එම වැඩසටහන රෝමයේදී පැවැත්වූ තෙවන අවස්ථාවයි. එහිදී දේශන හා සංස්කෘතික ප්‍රසංගයක් ද පැවැත් වූ අතර ඊට ඉතාලියේ ප්‍රගතිශීලී සංවිධානවල නියෝජිතයින් සහ ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසක් ද සහභාගී වූහ.

එහි ප්‍රධාන දේශනය පැවැත්වූයේ ජ.වි.පෙ. ස්වීඩන් කමිටුවේ සංවිධායක කුමාර ගිනිගත්ගල සහෝදරයා විසිනි.

එසේම ඊට ජාත්‍යන්තර සුභපැතුම් එක් කළ අය අතර ඉතාලියේ RETE DEI COMUNISTI සංවිධානයේ Mauro Luongo සහෝදරයා, AIASP CASA DEI POPOLI සංවිධානයේ Roberto Scorzoni සහෝදරයා, COMMITATO IMMIGRATI සංවිධානයේ Edgard Galiano සහෝදරයා, AMICIZIA ITALIA CUBA සංවිධානයේ Marco Papacci සහෝදරයා, PARTITO COMUNISTA ITALIANO සංවිධානයේ Gaetano Seminatore සහෝදරයා, ඉතාලියේ පලස්තීන ප්‍රජාවගේ මාධ්‍ය ප්‍රකාශක Salameh Ashour සහෝදරයා සහ විශ්වවිද්‍යාල ආචාර්ණී Alessandra Ciattini සහෝදරිය ඇතුළු පිරිසක් වූහ.

## මෙවර මැතිවරණයට SYU වෙතින් අපේක්ෂකයන් රැසක්



මෙවර පළාත් පාලන මැතිවරණය සඳහා සමාජවාදී තරුණ සංගමයෙන් අපේක්ෂක අපේක්ෂිකාවන් රැසක් ඉදිරිපත් කර ඇති බව එහි ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ප්‍රකාශ කළේය. ජනතා විමුක්ති පෙරමුණේ තරුණ සංවිධානය ලෙස මෙවර මැතිවරණය සඳහා දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය කරමින් තරුණ සහෝදර සහෝදරියන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇති බවත් තම පක්ෂයේ අනාගත නායකත්වය ගොඩනැගීමේ හා පක්ෂයට අලුත් තරුණ පිරිස් එකතු කරගැනීමේ අරමුණින් මෙලෙස සිදුකළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.